# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1853/52 - 2014 මාර්තු මස 15 වැනි සෙනසුරාදා - 2014.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 1/2013.

**2009 අංක 23 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය පනත**

19 වැනි වගන්තිය යටතේ රීති

2009 අංක 23 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය පනතේ 19 වැනි වගන්තිය ප්‍රකාර පාලක සභාව වෙත පැවරී ඇති බලතල අනුව ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකරී ආයතනයේ පාලන සභාව විසින් සාදනු ලැබ සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද රීති.

සභාපති,<br>
ශ්‍රී ලංකා සහතිකලත්<br>
කළමනාකරණ ගණකාධිකාරී ආයතනය.

2014 මාර්තු මස 05 වැනි දින,<br>
කොළඹ දී ය.

**රීති**

1. මෙම රීති 2013 අංක 01 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතන (පරිපාලන) රීති යනුවෙන් හැඳින්වේ.

2. මෙම රීති යටතේ සාමාජිකයකුට යැවිය යුතු සෑම දැන්වීමක් ම හෝ වෙනත් යම් නිවේදනයක් සාමාජිකයා විසින් සන්නිවේදනය සඳහා ඔහුගේ ලිපිනය වශයෙන් ප්‍රධාන විධායක නිලධාරියා වෙත අවසන්වරට දන්වා ඇති ලිපිනයට, විද්‍යුත් තැපැල හෝ සාමාන්‍ය තැපැල මඟින් හෝ බෙදා හැරීම මගින් යැවිය යුතු ය.

3. පාලක සභාවේ සෑම රැස්වීමකම දැන්වීමක් -

(i) එම රැස්වීමට අවම වශයෙන් දින හතකට පෙරාතුව පාලක සභාවේ එක් එක් සාමාජිකයාට ඔහු විසින් අවසන් වරට දන්වා ඇති ලිපිනයට ලියවිල්ලකින් බෙදා හැරීම හෝ තැපෑලෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් හෝ යැවිය යුතු ය.

(ii) එවැනි රැස්වීමක කිරීමට අපේක්ෂිත කටයුතු ප්‍රායෝගිකව කිරීමට සුදුසු න්‍යාය පත්‍රයක් ඇතුලත් විය යුතු ය.

4. පාලක සභාවේ අවසරයක් නොමැතිව පාලක සභාවේ අනුගාමී රැස්වීම් තුනකට සහභාගි වීමට අපොහොසත් වන සාමාජිකයකුගේ ධූරය එවැනි අවසන් රැස්වීමේ දින සිට අත්හැර ගියා සේ සැලකිය යුතු ය.

5. පාලක සභාවේ සාමාජිකයකුට ඕනෑම අවස්ථාවක පාලක සභාව අමතා යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, පාලක සභාව විසින් එය පිළිගත් දින සිට එම ඉල්ලා අස්වීම බලාත්මක බවට පත්විය යුතු ය. පාලක සභාවට සාධාරන හේතු දක්වා එවැනි ඉල්ලා අස්වීමක් පිළිගැනීම ප්‍රතික්ෂේප කළ හැකි ය.

6. ඕනෑම රැස්වීමක සියලු ප්‍රශ්න හෝ යෝජනා පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් බහුතර සංඛ්‍යාවක් විසින් තීරණය කළ යුතු ය.

7. පාලක සභාවේ රැස්වීම්වලදී සහ එහි කාරක සභා රැස්වීම්වල සියලු යෝජනා සම්මතයන් සහ කාර්ය සටහන් වාර්තා තබා ගත යුතු අතර, එවැනි ඕනෑම රැස්වීමක හෝ පසුව පැවැත්වෙන රැස්වීමක වාර්තා එම රැස්වීමේ සභාපතිවරයා විසින් අත්සන් කිරීම එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු ය.

8. පාලක සභාවේ යම් රැස්වීමක්, එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ එකඟත්වය මත සභාපතිවරයා විසින් කලින් කලට, ස්ථානයෙන් ස්ථානයට කල් තැබිය හැකි ය. එවැනි කල් තබන ලද රැස්වීමක දී, කල් තබන ලද රැස්වීමේ නිම කිරීමට නොහැකිව ඉතිරි වූ කටයුතු හැර වෙනත් කටයුතු නොකළ යුතු ය. කල් තැබීම සඳහා වූ යෝජනා සම්මතයේ එවැනි දැන්වීමක් ලබා දීම අවශ්‍යයයි සඳහන් කර ඇත්නම් මිස කල් තබන රැස්වීම පිළිබඳ කිසිදු දැන්වීමක් ලබා දීම නොකළ යුතු ය.

9. ආයතනයේ පොදු මුද්‍රාව පාලක සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් තැනැත්තකු හෝ තැනැත්තන් භාරයේ තැබිය යුතු අතර, පාලක සභාවේ අනුමැතිය ඇතිව පාලක සභාවේ යම් සාමාජිකයන් දෙදෙනෙකු සහ ප්‍රධාන විධායක නිලධරයා ඉදිරිපිට දී හැර කිසිදු සාධන පත්‍රයකට පොදු මුද්‍රාව තබනු නොලැබිය යුතු ය. එවැනි සාමාජිකයන් දෙදෙනෙකු සහ ප්‍රධාන විධායක නිලධරයා විසින් ඔවුන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයේ ඔවුන්ගේ නම් අත්සන් කල යුතු අතර, එකී අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිර විය යුතු ය. එසේ මුද්‍රාව තබන ලද සෑම සාධන පත්‍රයකම හා අත්සන් තබන ලද තැනැත්තන්ගේ නම් ඇතුලත් වාර්තාවක් ප්‍රධාන විධායක නිලධරයා විසින් තබා ගත යුතු ය.

10. පාලක සභාව විසින් කලින් කලට පාලක සභාවේ සාමාජිකයන් අතුරින් පමණක් හෝ එහි සාමාජිකයන් අතුරින් සහ ආයතනයේ සාමාජිකයන් අතුරින් යන දෙආකාරයෙන් එක් ආකාරයකට පහත සඳහන් කමිටු නිශ්චිත විෂයයන් සම්බන්ධ කටයුතු කිරීම සඳහා පත් කළ හැකි අතර, එවැනි කමිටුවල කාර්ය පරිපාටි විධිමත් කිරීම සඳහා රීති සකස් කළ හැකි ය. එවැනි කමිටු ඒකාබද්ධ කිරීමට හෝ විසුරුවා හැරීමට සහ අවශ්‍යයයි සලකනු ලබන අවස්ථාවල දී, කාර්ය ඉටු කිරීමේ කණ්ඩායම් සහ උප කමිටු අනුමත කිරීමේ බලය සභාවට තිබිය යුතු ය.

(i) විභාග කමිටුව ;
(ii) අධ්‍යාපන හා පුහුණු කමිටුව ;
(iii) සමුළු සහ සම්මන්ත්‍රණ කමිටුව ;
(iv) අඛන්ඩ වෘත්තිය සංවර්ධන කමිටුව ;
(v) චර්යා ධර්ම හා විනය කමිටුව ;
(vi) මුදල් හා පාලන කමිටුව ;
(vii) සඟරා, ප්‍රකාශන සහ ප්‍රවර්ධන කමිටුව ;
(viii) ගිණුම්කරණ සහ පිරිවැය ගිණුම් ප්‍රමිති කමිටුව ;
(ix) රාජ්‍ය අංශ ගිණුම්කරන සහ විගණන ප්‍රමිති කමිටුව ;
(x) ව්‍යාපාරයේ නියුතු වෘත්තිය ගණකාධිකරී කමිටුව ;
(xi) සාමාජික සහ ශිෂ්‍ය කටයුතු කමිටුව ;
(xii) සංගමික පාලනය සහ විෂයානුබද්ධ වාර්තාකරණ කමිටුව ;
(xiii) බැංකු සහ රක්ෂණ කමිටුව
(xiv) කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර කමිටුව.

11. පාලක සභාව විසින් කලින් කලට ආයතනයේ සාමාජිකයන්ගේ ලැයිස්තුවක් ප්‍රකාශයට පත් කිරීම හෝ ප්‍රකාශයට පත්කිරීමට සැලැස්වීම කළ යුතු ය.

12. මේ පනතේ හෝ ඒ යටතේ සකස් කරන ලද රීති සහ තත්කාර්ය සඳහා කලින් කලට පාලක සභාව විසින් කරන ලද යෝජනා සම්මතයන්ට අනුකූලව පාලක සභාව විසින් පවරනු ලැබිය හැකි යම් බලතල ක්‍රියාත්මක කළ යුතු සහ යම් කාර්යයන් ඉටුකළ යුතු ප්‍රධාන විධායක නිලධාරිවරයකු පාලක සභාව විසින් පත් කළ යුතු ය.

13. ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ අනෙකුත් නිලධාරින්ගේ හා සේවකයන්ගේ වැටුප් සහ දීමනා සහ සේවා නියමයන් සහ කොන්දේසි පාලක සභාව විසින් කලින් කලට නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට තිබිය යුතු ය.

14. (අ) ආයතනය විසින් ලබා ගන්නා ලද හෝ ආයතනය වෙනුවෙන් ලැබුණු සියළුම මුදල් පාලක සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි පරිදි ශ්‍රී ලංකාවේ එක් බැංකුවක හෝ බැංකුවල පවත්වාගෙන යනු ලබන එක් ගිණුමක හෝ ගිණුම්වලට ගෙවනු ලැබිය යුතු ය. ලියන ලද සෑම චෙක්පතක්ම පාලක සභාවේ සාමාජිකයන් දෙදෙනෙකු විසින් හෝ පාලක සභාවේ සාමාජිකයකු සහ ප්‍රධාන විධායක නිලධාරියා විසින් හෝ බලයලත් නිලධාරියකු විසින් හෝ ප්‍රධාන විධායක නිලධාරියා සහ බලයලත් නිලධාරියකු විසින් කලින් කලට පාලක සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි කොන්දේසි හා සීමාවන්ට යටත්ව අත්සන් කරනු ලැබිය යුතු ය.

(ආ) ආයතනයේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදලක් රජයේ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීමට හෝ එවැනි අරමුදල් ඕනෑම පිළිගත් වානිජ බැංකුවක හෝ පිළිගත් මූල්‍ය ආයතනයක කාලීන තැන්පතුවල තැන්පත් කිරීමට සභාවට බලය තිබිය යුතු ය.

15. ආයතනයේ පරමාර්ථ වලට පටහැනි නොවන නිශ්චිත කාර්යයන් සඳහා ආයතනය වෙනුවෙන් දෙනු ලබන යම් ත්‍යාග, රික්තවර්ණ, හෝ වෙනත් මූල්‍ය පරිත්‍යාගයන් පාලක සභාව විසින් ලබා ගැනීම සහ භාවිතයට ගැනීම කළ හැකිය. එසේ ලැබෙන මුදල් ආයතනයේ පොදු අරමුදලෙන් වෙන්ව ගණනය කරනු ලැබීම හා ඒවා සම්බන්ධයෙන් ක්‍රියාකරනු ලැබීම සිදු කළ යුතු ය.

16. ආයතනය විසින්, එළඹෙන වර්ෂයේ මාර්තු තිස් එක් වන දිනට පසු නොවන දිනයක දී හෝ සෑම වර්ෂයකම පාලක සභාව විසින් තීරණය කරනු ලබන පසු දිනයක, පසුගිය වර්ෂයේ දෙසැම්බර් තිස් එක් වන දිනයෙන් අවසන් වන කාලය සඳහා ආදායම් සහ වියදම් ගිණුම් සහ ශේෂ පත්‍රය ඇතුළත් කරන ලද වාර්ෂික ගිණුම සකස් කළ යුතු අතර, එහි පිටපත් සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ කටයුතු විෂයය පරවා ඇති අමාත්‍යවරයා වෙත සහ ආයතනයේ එක් එක් සාමාජිකයා වෙත සපයනු ලැබිය යුතු ය.

17. මෙම රීතින්හි උපලේඛනයේ දක්වා ඇති පරිදි ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා ගැනීම සඳහා වන ඉල්ලුම්පත් "එම්" ආකෘතිය අනුව සහ අධිසාමාජිකත්වය සඳහා වන සාමාජිකයන් උපලේඛණයේ "එෆ්" ආකෘතිය අනුව සැකසිය යුතු ය.

18. කිසිදු තැනැත්තකු ඃ

(අ) ඔහු අවුරුදු විසි එකට එළඹීම සහ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම හෝ පාලක සභාව විසින් අනුමත කරනු ලැබූ තැනැත්තකු වූයේ නම් මිස ;

(ආ) ඔහු සිහිවිකල් තැනැත්තකු බවට නිසි අධිකරණයක් මඟින් විනිශ්චය කර ඇත්නම් ;

(ඇ) නිසි අධිකරණයක් මඟින් වස්තුභංගත්වයක් හෝ බුන්වත්භාවයක් ඇති බවට නියම කර ඇත්නම් අනපේක්ෂිත පාඩුවීම් හෝ විපත්වලින් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් ඔහුගේ වස්තුභංගත්වය හෝ බුන්වත්භාවය ඇති වී තිබෙන බවට විගණකවරයකුගෙන් ලබාගත් සහතිකයක් ඇත්නම් මිස ;

(ඈ) ශ්‍රී ලංකාව තුළ දී හෝ වෙනත් තැනක දී සදාචාර විරෝධී ක්‍රියාවකට සම්බන්ධ වරදක් සිදුකර සහ ඒ වරද සිදු කිරීම සම්බන්ධයෙන් බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් දිය හැකි ලෙසට නිසි අධිකරණයක් මඟින් ඔහු වරදකරු කර ඇත්නම්, එසේ වරදකරු කිරීමට එරෙහිව මහාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර නොමැති නම්, ඔහුගේ දඬුවම අවලංගු කර ඇති නම් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති විසින් පොදු සමාවක් දී ඇත්නම් මිස,

ආයතනයේ සාමාජිකයකු ලෙස බඳවා නොගත යුතු ය.

19. ආයතනයේ සාමාජිකයකු 18 වැනි රීතියේ (ආ) හෝ (ඇ) හෝ (ඈ) ඡේදයන්හි සඳහන් යම් නුසුදුසුකමකට යටත් වේ නම්, පාලක සභාව විසින් සාමාජිකත්වය අවලංගු කළ යුතු ය.

එසේ වුව ද, එවැනි තැනැත්තකු සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරවරයකු ලෙස වෘත්තියේ යෙදීමට සුදුසු තැනැත්තකු බවට පාලක සභාව සෑහීමට පත් වේ නම්, නැවත සාමාජිකත්වයේ පිහිටුවීමට උක්ත ඉවත් කිරීම බාධාවක් නොවිය යුතු ය.

20.වෘත්තිය විෂමාචාරයට වරදකරු වීමේ හේතුව මත ආයතනයේ යම් සාමාජිකයකු සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරිවරයකු වශයෙන් කටයුතු කිරීමට නුසුදුසු බවට පාලක සභාව සෑහීමට පත්වන්නේ නම් පාලක සභාව විසින් ඔහුගේ සාමාජිකත්වය අවලංගු කළ හැකි ය.

21. ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු වශයෙන් ඇතුලත් කර ගැනීම හෝ වසර පහකට පසුව අධිසාමාජිකත්වයට තෝරා ගැනීම පාලක සභාව මඟින් සිදු කරනු ලබන අතර, එවැනි සෑම ඉල්ලුම්කරුවකුම පාලක සභාව විසින් කලින් කලට නියම කරන ලද කොන්දේසි සපුරා ඇති බවට හා 18 වැනි රීතියට අනුකූල බවට පාලක සභාව සෑහීමට පත් විය යුතු ය. ඇතුලත් කර ගැනීම හෝ තෝරා ගැනීම සඳහා යෝග්‍යතාව තහවුරු කිරීම කෙරෙහි සාක්ෂි පාලක සභාවට අවශ්‍ය තාක් දුරට ඉදිරිපත් කිරීම ද කළ යුතු ය.

22.යම් තැනැත්තකු ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු වශයෙන් ඇතුලත් කර ගැනීමෙන් හෝ ආයතනයේ අධිසාමාජිකයකු වශයෙන් තෝරා ගැනීමෙන් පසු ඔහු ආයතනයේ පොදු මුද්‍රාව යටතේ බලාත්මක වන සාමාජිකත්ව සහතිකයකට හිමිකම් ලැබිය යුතු ය.

23. සාමාජිකත්වය පිළිබඳ සෑම සහතිකයක්ම ආයතනයේ දේපලක් ලෙස පැවතිය යුතු අතර, එවැනි සහතිකයක් පාලක සභාව වෙත කැඳවීමට, එය ඉදිරිපත් කරන ලෙස ඕනෑම වේලාවක ඉල්ලා සිටීමට සහ ආයතනයට භාරදීමට පාලක සභාවට නිදහස තිබිය යුතු ය. ආයතනයේ සාමාජිකත්වය අවසන් කරන සෑම තැනැත්තකුම, පාලක සභාව හෝ ප්‍රධාන විධායක නිලධාරියා එසේ දැන්වූ විගස ඔහුගේ සාමාජිකත්ව සහතිකය අවලංගු කිරීම සඳහා ආයතනයට ආපසු බාර දිය යුතු ය.

24. පාලක සභාවේ අදහස අනුව ආයතනයේ තත්ත්වයට සමාන ආයතනයක් හෝ ගණකාධිකාරී සංගමයක් ලෙසට අනුමත කරන ලද කුමන නමකින් හෝ හඳුන්වනු ලබන ආයතනයක හෝ ගණකාධිකාරී සංගමයක සාමාජිකයකු බවට පාලක සභාව සෑහීමට පත් කරන යම් අයදුම්කරුවකු පාලක සභාව තම පරම අභිමතය මත පැනවූ අවශ්‍යතාවයන් සහ 18 වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව ආයතනයේ සාමාජිකයකු ලෙස ඇතුලත් කර ගත හැකි ය.

25. ආයතනයේ සාමාජිකත්වය සඳහා වන අයදුම්කරුවන් පාලක සභාව විසින් නිශ්චය කර ඇති ගාස්තු ගෙවිය යුතු ය. වර්තමාන ගාස්තු පහත සඳහන් පරිදි වන අතර, මෙම ගාස්තු පාලක සභාව විසින් කලින් කලට කරනු ලබන සංශෝධනයන්ට යටත් වේ.

| | | *සී එම් ඒ ශිෂ්‍යයන්* | *වෙනත් අයදුම්කරුවන්* |
|---|---|---|---|
| ආශ්‍රිත සාමාජිකයකු වශයෙන් ඇතුළත් කිරීම | : | රු.9,500/- | රු.17,500/- |
| අධි සාමාජිකයකු වශයෙන් තෝරා ගැනීම | : | රු.5,000/- | රු.18,500/- (ඍජු අධි සාමාජිකත්වය) |
| ආශ්‍රිත සාමාජිකත්වය - අලුත් කිරීම | : | රු.5,500/- | රු.5,500/- |
| අධි සාමාජිකත්වය - අලුත් කිරීම | : | රු.6,500/- | රු.6,500/- |

26. සාමාජිකත්වය අලුත් කිරීම සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම මෙහි උපලේඛනයේ දක්වා ඇති "ආර්" ආකෘතිය ප්‍රකාර විය යුතු අතර, පාලක සභාව විසින් කලින් කලට නිශ්චය කරනු ලැබිය හැකි අඛන්ඩ වෘත්තිය සංවර්ධනය පවත්වාගෙන යාමට අදාල රීතීන්ට අනුකූල විය යුතු ය.

27. වයස අවුරුදු හැත්තෑව ඉක්ම වූ සහ සක්‍රිය සේවයෙන් විශ්‍රාම ලැබූ හෝ වෙනත් ව්‍යාපාරික කටයුතු වලින් විශ්‍රාම ගිය යම් සාමාජිකයකු විසින් මෙහි උපලේඛනයේ "ආර් I" ආකෘතියට අනුකූලව ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් වෙනුවෙන්, පාලක සභාව විසින් එහි අභිමතය පරිදි කලින් කලට තීරණය කරනු ලබන පරිදි සාමාජිකත්වය අලුත් කිරීම සඳහා වන අඩු කරන ලද ගාස්තුවක් ගෙවීමට අවසර දිය හැකි ය.

එසේ වුවද, වයස අවුරුදු හැත්තෑ පහ සහ ඊට වැඩි සාමාජිකයන් සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තුවෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

28. සෑම වසරකම මාර්තු මස පළමුවන දිනයට හෝ එක් එක් වසරේ දීර්ඝ කරන ලද දිනයට පෙර සාමාජිකත්වය අලුත් කිරීමට අපොහොසත් වන සාමාජිකයන්ගේ තොරතුරු අවශ්‍ය කටයුතු සඳහා පාලක සභාව වෙත වාර්තා කළ යුතු අතර, නියමිත දිනයට පෙරාතුව සාමාජිකත්වය අලුත් කිරීම සඳහා වන ගාස්තුව නොගෙවීම නිසා සාමාජිකත්වය අවලංගු වූ තැනැත්තකුගේ සාමාජිකත්වය ගෙවිය යුතු ව ඇති සියලු ගෙවීම් සහ පාලක සභාව විසින් ඔහු වෙත පවරනු ලැබිය හැකි දඩ මුදලක්ද සමඟ ගෙවීම මත පාලක සභාවේ අභිමතය පරිදි නැවත සාමාජිකත්වයේ පිහිටුවිය හැකි ය.

29. ආයතනයේ සියලුම සාමාජිකයන් පාලක සභාව කලින් කලට නිශ්චය කරනු ලබන අඛන්ඩ වෘත්තිය සංවර්ධන අවශ්‍යතාවයන් සපුරාලීම අවශ්‍ය වේ.

30. විගණකවරයාගේ වාර්තාව සමඟ පාලක සභාවේ වාර්තාව සහ ආයතනයේ ගිණුම් ලබාගැනීමට සහ සලකා බැලීම සඳහා ආයතනයේ සාමාජිකයන්ගේ වාර්ෂික මහ සභා රැස්වීමක් පාලක සභාව විසින් තීරණය කරනු ලබන පරිදි සෑම වාර්ෂයකම යම් ස්ථානයක සහ යම් දිනයක පැවැත්විය යුතු ය.

31. ආයතනයේ සාමාජිකයන්ගේ යම් වාර්ෂික මහ සභා රැස්වීමකට අවම වශයෙන් දින දාහතරකට පෙරාතුව ප්‍රධාන විධායක නිලධාරියා විසින් රැස්වීම පැවැත්වෙන දිනය, වේලාව සහ ස්ථානය සහ එහි දී කල යුතු කාර්යයන් සඳහන් දැන්වීමක්, වාර්ෂික වාර්තාව ද සමඟ එක් එක් සාමාජිකයා වෙත යැවිය යුතු ය. ආයතනයේ වාර්ෂික මහ සභා රැස්වීමක ගණපූරණය සාමාජිකයන් දස දෙනෙකු විය යුතු ය.

32. ආයතනයේ සාමාජිකයන්ගේ යම් වාර්ෂික මහ සභා රැස්වීමක දී එකී රැස්වීම සඳහා නියමිත වේලාව පසු වී පැය භාගයක් ඇතුලත සාමාජිකයින් දසදෙනෙකු පෞද්ගලිකව පැමිණ නොසිටී නම්, එම රැස්වීම එම ස්ථානයේ එම වේලාවටම පැවැත්වීමට දෙසතියකට කල් තැබිය යුතු ය. කල් තබන ලද රැස්වීම පැවැත්වෙන දිනයේ සාමාජිකයන් දස දෙනෙකුට අඩු ගණනක් පැමිණ සිටිය ද, රැස්වීමෙහි කටයුතු නියමිත පරිදි කළ යුතු ය.

33. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම රීතීන්හි ;

"පනත" යන්නෙන් 2009 අංක 23 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය පනත අදහස් වේ ;

"බලයලත් නිලධාරියා" යන්නෙන් 14 රීතියේ කාර්ය සඳහා සභාව විසින් නම් කරන ලද ආයතනයේ නිලධරයකු අදහස් වේ ;

"සභාපතිවරයා" යන්නෙන් පාලක සභාවේ ඕනෑම රැස්වීමක් මුලසුන දරන තැනැත්තා අදහස් වේ ;

"ප්‍රධාන විධායක නිලධරයා" යන්නෙන්, පනතේ 15(I) වගන්තිය යටතේ පාලක සභාව විසින් පත් කරනු ලබන ප්‍රධාන විධායක නිලධාරියා අදහස් වන අතර, ප්‍රධාන විධායක නිලධරයා වශයෙන් වැඩ බලන වෙනත් යම් නිලධරයකු හෝ යම් තැනැත්තකු ඇතුළත් වේ ;

"සභාව" යන්නෙන් ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ පාලක සභාව අදහස් වේ ;

"ආයතනය" යන්නෙන් 2009 අංක 23 දරන පනත යටතේ පිහිටුවා ඇති ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරන ගණකාධිකාරී ආයතනය අදහස් වේ ;

"සාමාජිකයා" යන්නෙන් ආයතනයේ සාමාජිකයකු අදහස් වේ.

(17 වන රීතිය)

*උපලේඛනය*

*'එම්' ආකෘතිය*

ප්‍රධාන විධායක නිලධාරී,
ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය,
29/24, විශාකා පාර,
කොළඹ 04.

**ආයතනයේ සාමාජිකත්වය සඳහා ඉල්ලුම් පත්‍රය**

මම ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයකු ලෙස බඳවා ගැනීම සඳහා ඉල්ලුම් කරන අතර, බඳවා ගැනීමේ ගාස්තුව වන රු.: ...................................................... සඳහා චෙක්පතක් සමග පහත විස්තරද ඉදිරිපත් කරමි.

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :—————,
2. ව්‍යාපාර නාමය (තිබේ නම්) :—————,
3. තැපැල් ලිපිනය :—————,
4. උපන් දිනය :—————,
5. වෘත්තිය ගණකාධිකරණ සුදුසුකම් :—————,
6. අයදුම්කරු නොකඩවා නිරත වූ ප්‍රායෝගික පුහුණු කාල සීමාව : (අදාළ ආයතනය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූලව ප්‍රායෝගික පුහුණු විස්තර ඇමිණිය යුතු ය) :—————,
7. පුරවැසිභාවය :—————,
8. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු නොවේ නම් :—————,
   (i) නේවාසික අවසර පත් අංකය :—————,
   (ii) ඔහු ශ්‍රී ලංකාවේ වාසය කල කාල සීමාව සඳහන් කරන්න :—————,
9. අයදුම්කරු විදේශීය ගණකාධිකාරී ආයතනයක සාමාජිකයකු නම් එම ආයතනයේ විස්තර :—————,
10. ............................................................................ වන මම ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ 2013 අංක 01 දරන (පරිපාලන) රීතීන්හි 18 හි දක්වා ඇති නුසුදුසුකම් කිසිවකට යටත් නොවන බැව් මෙයින් ප්‍රකාශ කරමි.

| | |
|---|---|
| ............................................................. | ............................................................. |
| දිනය | අත්සන |

(17 වන රීතිය)

*'එෆ්' ආකෘතිය*

ප්‍රධාන විධායක නිලධාරී,
ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය,
29/24, විශාකා පාර,
කොළඹ 04.

**ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකයකු ලෙස තෝරා පත් කර ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය**

* ............................................................................................ මම ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයකු වන අතර, ආයතනයේ අධිසාමාජිකයකු ලෙස තෝරා පත් කර ගැනීම සඳහා මෙයින් අයදුම් කරන අතර, ඒ සඳහා ගාස්තුව වන රු.: ...................................................... සඳහා චෙක්පතක් මේ සමඟ ඉදිරිපත් කරමි.

| | |
|---|---|
| ................................................................. | ................................................................. |
| දිනය | ඉල්ලුම්කරුගේ අත්සන |

ලිපිනය :
විද්‍යුත් තැපැල :
දුරකථනය/ෆැක්ස් :
*සම්පූර්ණ නම ඇතුළත් කළ යුතු ය.

(26 වන රීතිය)

*'ආර්' ආකෘතිය*

ප්‍රධාන විධායක නිලධාරී,
ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය,
29/24, විශාකා පාර,
කොළඹ 04.

**සී. එම්. ඒ. ආයතනයේ සාමාජිකත්වය අලුත් කිරීමේ ඉල්ලුම් පත්‍රය**

* ............................................................................................ මම ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සාමාජිකත්වය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කරනු ලබන අතර, ඒ සඳහා ගාස්තුව වන රු.: ...................................................... සඳහා චෙක්පතක් මේ සමඟ ඉදිරිපත් කරමි.

මම ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ 2013 අංක 01 දරන (පරිපාලන) රීති 18 හි සඳහන් නුසුදුසුකම් කිසිවකට යටත් නොවන බැව් මෙයින් ප්‍රකාශ කරමි.

| | |
|---|---|
| ................................................................. | ................................................................. |
| දිනය | අත්සන |

*සම්පූර්ණ නම ඇතුළත් කළ යුතු ය.

(27 වන රීතිය)

*'ආර් 1' ආකෘතිය*

ප්‍රධාන විධායක නිලධාරී,
ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය,
29/24, විශාකා පාර,
කොළඹ 04.

**27 වන රීතිය යටතේ සාමාජිකත්වය අලුත් කිරීම සඳහා වන ගාස්තු අඩුකිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රය**

* ............................................................................................ වන මම මෙයින් ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අඩු කරන ලද ගාස්තු යටතේ සාමාජිකත්වය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කරන අතර, අඩු කරන ලද ගාස්තුව වන රු.: ....................................................... සඳහා චෙක්පතක් මේ සමඟ ඉදිරිපත් කරමි.

මම ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ 2013 අංක 01 දරන (පරිපාලන) රීතීන් හි රීති 18 හි සඳහන් නුසුදුසුකම් කිසිවකට යටත් නොවන බව මෙයින් ප්‍රකාශ කරමි.

මගේ වයස අවුරුදු හැත්තෑව (70) ඉක්මවන බව ද, සේවා නියුක්තියෙන් හා වෙනත් ව්‍යාපාර කටයුතු වලින් විශ්‍රාම ලබා සිටින බව ද ප්‍රකාශ කර සිටිමි.

| | |
|---|---|
| ............................................................... | ............................................................... |
| දිනය | අත්සන |

*සම්පූර්ණ නම ඇතුළත් කළ යුතු ය.

03 - 1026/1

---

එල්.ඩී.බී. 1/2013.

**2009 අංක 23 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය පනත**

19 වන වගන්තිය යටතේ රීති

2009 අංක 23 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය පනතේ 19 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ පාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සකස් කරන ලද සහ සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද රීති.

සභාපති,
ශ්‍රී ලංකා සහතිකලත්
කළමනාකරණ ගණකාධිකාරී ආයතනය.

2014 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

**රීති**

1. මෙම රීති 2013 අංක 02 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතන (ඇතුළත් කිරීමේ හා විභාග) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (අ) ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය සඳහා අවශ්‍ය යම් තැනැත්තකු සුදුසුකම් ලැබීම පිණිස ආයතනයේ ඕනෑම විභාගයකට පෙනී සිටීම සඳහා සහ මෙම රීති මගින් නියම කර ඇති ආකාරයට අනුමත පුහුණු පාඨමාලාවක් හැදෑරීම සඳහා, (මෙම රීතීන්හි මින්මතු "ලියාපදිංචි ශිෂ්‍යයා" ලෙස හඳුන්වනු ලබන) යම් තැනැත්තකු ආයතනයේ ශිෂ්‍යයෙකු වශයෙන් ලියාපදිංචි විය යුතු ය.

(ආ) විභාග ව්‍යුහය සහ ආකෘතිය සහ විෂයමාලාව කලින් කලට මාරු කිරීමට, වෙනස් කිරීමට හෝ සීමා කිරීමට පාලක සභාවට බලය තිබිය යුතු ය.

3. ආයතනයේ ශිෂ්‍යයෙකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය යම් තැනැත්තකු ආයතනය විසින් පලකරන ප්‍රසිද්ධ දැන්වීමකට ප්‍රතිචාර වශයෙන් අවශ්‍ය ලේඛන ද සමඟ අයදුම්කල යුතු ය. අයදුම්පත් කැඳවීමේදී පාලක සභාව විසින් එක් එක් ලිත් වර්ෂයේ දෙවරක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන පුවත්පත් වලින් අවම වශයෙන් එක් පුවත්පතකවත් අයදුම්පත් කැඳවීම් දැන්වීමක් පළ කරනු ලැබිය යුතු ය.

4. ශිෂ්‍යයෙක් වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා සහ නිදහස් කිරීම සඳහා, සලකා බලන යම් තැනැත්තකු සතුව පහත සඳහන් අධ්‍යාපන හෝ වෘත්තීය සුසුදුකම්වලින් එක් සුදුසුකමක් තිබිය යුතුය ෘ-

(1) (අ) ඉංග්‍රීසි මාධ්‍ය සඳහා -

අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් සහ ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී විෂයයන් දෙකකින් සමත් වීම ;

(ආ) සිංහල හෝ දෙමළ මාධ්‍යය සඳහා -

අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය සඳහා සාමාන්‍ය සාමාර්ථ සහිතව අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී විෂයයන් දෙකකින් සමත් වීම.

(2) පූර්ණ හෝ අර්ධ සුදුසුකම් නිදහස් කිරීම් සමඟ ලියාපදිංචි වීම සඳහා -

(අ) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයක හෝ ආයතනයේ පාලක සභාව විසින් අනුමත කරන ලද වෙනත් යම් විශ්වවිද්‍යාලයක අදාල උපාධියක් ;

(ආ) ශ්‍රී ලංකා රජයේ ගණකාධිකාරී සේවයේ සාමාජිකත්වය ;

(ඇ) එක්සත් රාජධානියේ වරලත් ලේකම්වරුන්ගේ සහ පරිපාලකයින්ගේ ආයතනයේ අවසාන විභාගය ;

(ඈ) එක්සත් රාජධානියේ මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ අවසාන විභාගය ;

(ඉ) එක්සත් රාජධානියේ ජාත්‍යන්තර ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ අවසාන විභාගය ;

(ඊ) ලන්ඩනයේ හෝ ශ්‍රී ලංකාවේ බැංකුකරුවන්ගේ ආයතනයේ අවසාන විභාගය ;

(උ) වරලත් අලෙවිකරණ ආයතනයේ අවසාන විභාගය ;

(ඌ) වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ අවසාන විභාගය ;

(එ) වෘත්තීය, විශ්වවිද්‍යාල වෘත්තීය පුහුණු සහ වෙනත් සුදුසුකම්වල අර්ධ සුදුසුකම් පිළිබඳව එක් එක් දැ පදනම් කරගෙන සලකා බලනු ලැබේ ;

(ඒ) ශ්‍රී ලංකා ඒඒටී අවසන් විභාගය ;

(ඔ) ගණකාධිකරණ පරිපාලන ආයතනයේ අවසන් විභාගය (අයිඒබී) ;

(ඕ) සේවාදායකයා විසින් නිර්දේශ කළ ගිණුම්කරණ පරිසරයක අවම වශයෙන් අවුරුදු දෙකක කාලයක පලපුරද්ද සහිතව සේවයේ නියුක්ත සහ වයස අවුරුදු 21 ට වඩා වැඩි තැනැත්තන් ;

(ක) ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ කළමනාකරණය පිළිබඳ අවසන් විභාගය ;

(ග) එක්සත් රාජධානියේ ඒ සී සී ඒ අවසන් විභාගය ;

(ච) එක්සත් රාජධානියේ සී අයි එම් ඒ අවසන් විභාගය ;

(ඡ) දකුණු ආසියානු ගණකාධිකාරීන්ගේ සංගමයේ සහ අන්තර් ජාතික ගණකාධිකාරවරුන්ගේ සම්මේලනයේ සාමාජිකයන් වන වෘත්තීය ගණකාධිකාරී ආයතනවල අවසන් විභාගය ;

(ණ) අ.පො.ස. සාමාන්‍ය පෙල විෂයන් හයක් සමත් ශිෂ්‍යයන් සඳහා ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය විසින් පවත්වනු ලබන වර්තන පාඨමාලාව

(ඩ) පාලක සභාව විසින් කලින් කල අනුමත කරනු ලබන වෙනත් යම් සුදුසුකම්.

එසේ වුවද, කලින් කලට ඇතුලත්වීමේ සුදුසුකම් සංශෝධනය කිරීමට පාලක සභාවට බලය තිබිය යුතු ය.

5. පාලක සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලබන වාර්ෂික අලුත් කිරීමේ ගාස්තුව සහ මූලික ලියාපදිංචි වීමේ ගාස්තුව ආයතනයට ගෙවනු ලබන තෙක් එවැනි තැනැත්තෙකු ආයතනයේ ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වූවකු සේ සලකනු නො ලැබිය යුතු ය.

6. ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තුව, අදාල වර්ෂයේ මාර්තු මස පළමුවන දිනයට පෙර ගෙවීමට අපොහොසත් වන තැනැත්තෙකුගේ ලියාපදිංචිය අවලංගු වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

7. පූර්වයෙන් වූ රීතිය ප්‍රකාරව ලියාපදිංචිය අවලංගු වූ යම් තැනැත්තකු විසින් රුපියල් දෙදහසක දඩයක් සමග පවතින ගාස්තුව අනුව ගණනය කරනු ලබන සියලු අයවිය යුතු මුදල් හෝ සභාව විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් මුදලක් ගෙවනු ලැබූ විට සභාවේ අභිමතය මත ලියාපදිංචිය නැවත ලබාදිය හැකි ය.

8. සියලු ලියාපදිංචි ශිෂ්‍යයන්ගේ නාමලේඛනයක් හෝ දත්ත සමුදායක් ආයතනයේ පාලක සභාව විසින් පවත්වාගෙන යා යුතු ය.

9. ලියාපදිංචි ශිෂ්‍යයන්ට අදාල වන පරිදි පාලක සභාව විසින් සකස් කර පවත්වාගෙන යනු ලබන ඕනෑම රීතියකින් ලියාපදිංචි ශිෂ්‍යයෙක් බැඳී සිටින අතර, ලියාපදිංචි ශිෂ්‍යයන් එවැනි යම් රීතියකට එකඟ නොවන අවස්ථාවක දී ඔවුනට එරෙහිව විනයානුකූල පියවර ගැනීමට පාලක සභාවට හැකියාවක් තිබිය යුතු ය.

*විභාග පොදු*

10. (1) (අ) පාලක සභාව විසින් මෙම රීතිවල නියම කරන ලද විභාග පවත්වාගෙන යාම සඳහා පාලක සභාවේ සාමාජිකත්වය දරන සාමාජිකයන් පස් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත විභාග කමිටුව ලෙස නම් කල කමිටුවක් පත් කල යුතු අතර, එහි සාමාජිකයන් අතුරින් එක් අයෙකු සභාපති ලෙස පත් කල යුතු ය. මෙසේ පත්කල කමිටුවේ එක් එක් සාමාජිකයාගේ නිල කාලය පාලක සභාව විසින් තීරණය කරන පරිදි වූ කාල සීමාවන් සඳහා පාලක සභාව විසින් දීර්ඝ කල හොත් මිස එක් අවුරුද්දක කාලයක් සඳහා ධූර දැරිය යුතු ය. යම් විභාග කමිටුවක රැස්වීමක ගණපූරණය සාමාජිකයන් තුන්දෙනෙකු විය යුතු ය.

(ආ) යම් රජයේ හෝ පෞද්ගලික අධ්‍යාපන ආයතනයක සී එම් ඒ ශ්‍රී ලංකා විභාග සඳහා සම්මන්ත්‍රණ පවත්වනු ලබන යම් පාලක සභාවක සාමාජිකයකු, පාලක සභාව විසින් විභාග ප්‍රතිඵල හෝ විභාගවලට අදාල වෙනත් යම් කරුණක් සලකා බලනු ලබන අවස්ථාවක දී, පාලක සභාවේ සියලු සාමාජිකයන් විසින් සම්පූරණ කරන ලද ප්‍රකාශයක් ලබාගැනීමෙන් පසුව බැහැර කල යුතු ය.

(ඇ) කලින් කලට යම් විභාග ව්‍යුහය වෙනස් කිරීමට හෝ සීමාකිරීමට පාලක සභාවට බලය තිබිය යුතු ය.

(2) විභාග කමිටුවට පහත සඳහන් බලතල තිබිය යුතු ය.

(අ) මෙම රීතිවල සඳහන් එක් එක් විභාග පවත්වනු ලබන වේලාව සහ ස්ථානය විධිමත් කිරීම සහ එවැනි එක් එක් විභාග පැවැත්වීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් කටයුතු සම්පාදනය කිරීම ;

(ආ) පාලක සභාවේ අනුමතිය ඇතිව කලින් කල එවැනි එක් එක් විභාගයන්ට අදාලව ව්‍යුහය, විෂයයන් සහ විෂය නිර්දේශ නිශ්චය කිරීම ;

(ඇ) 13 රීතිය යටතේ පාලක සභාව විසින් සුදුසු යයි සලකනු ලබන පරිදි එහි සාමාජිකයන් අතුරින් හෝ පරීක්ෂකවරුන්, ප්‍රමාණකරුවන් සහ පරිවර්තකයන් මඩුල්ල අතුරින්, පරීක්ෂකවරුන්, ප්‍රමාණකරුවන් සහ පරිවර්තකයන් පත් කිරීම ;

(ඈ) විභාග පවත්වනු ලබන එක් එක් දිනයේ එක් එක් විභාගය නිරීක්ෂණය කිරීම සඳහා නිරීක්ෂකවරුන් වශයෙන් සුදුසු පුද්ගලයින් පත් කිරීමට ප්‍රතිපාදන සැලසීම ;

(ඉ) එක් එක් විභාගය සඳහා පරීක්ෂකවරුන්ගේ සහ ප්‍රමාණකරුවන්ගේ වාර්තා සලකා බලා ඒවා පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ අවශ්‍ය යයි සලකන පරිදි යම් සංශෝධනය කිරීම් හෝ වෙනස් කිරීම් වලට යටත්ව පිළිගැනීම

(ඊ) එවැනි එක් එක් විභාගවල ප්‍රතිඵල අනුමැතිය සඳහා පාලක සභාවට වාර්තා කිරීම ; සහ

(උ) විභාග කමිටු විසින් උප කමිටු වෙත පවරන ලද කාර්යයන් ඉටුකිරීම සඳහා සාමාජිකයන් අතරින් හෝ වෙනත් සුදුසු සහ යෝග්‍ය තැනැත්තන් අතරින් උප කමිටු පත් කිරීම

එසේ වුව ද, මෙම ජේදයේ (ඇ) උපජේදයේ පටහැනිව කුමක් සඳහන් වුව ද විශේෂ අවශ්‍යතාවන් ඇතිවන අවස්ථාවක දී, පාලක සභාවේ ස්ථිර කිරීමට යටත්ව, එහි පළමු හෝ පසු රැස්වීම් වලදී වෙනත් යම් සුදුසුකම්ලත් සහ දක්ෂ තැනැත්තන්, පරීක්ෂකවරුන් සහ ප්‍රමාණකරුවන් විභාග කමිටුව විසින් පත් කල හැකි ය.

(3) මෙම රීති යටතේ පත්කරනු ලබන පරීක්ෂකවරුන්, ප්‍රමාණකරුවන්, පරිවර්තකයින් සහ නිරීක්ෂකවරුන්ට පාලක සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලබන ගාස්තු ගෙවිය හැකි ය.

(4) මෙම රීති යටතේ පත්කරනු ලබන පරීක්ෂකවරුන් සහ ප්‍රමාණකරුවන් විසින් පාලක සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි වෙනත් එවැනි සභායන් ද සහිතව ලිඛිතව සහ වාචිකව හෝ පරිගණක පදනම් කරගත් විභාග වලට පෙනී සිටි විභාග අපේක්ෂකයින් පරීක්ෂා කොට එකී විභාග ප්‍රතිඵල එම විභාග පැවැත්වීමෙන් පසු ප්‍රායෝගිකව හැකි ඉක්මනින් විභාග කමිටු වෙත වාර්තා කල යුතු ය.

(5) ශිල්පීය අදියර (පළමු මට්ටම) හෝ අන්තර් මධ්‍ය අදියර (දෙවන මට්ටම), වෘත්තීය අදියර I (තෙවන මට්ටම) හෝ වෘත්තිය අදියර II (සිව්වන මට්ටම) සමත්වන සෑම අපේක්ෂකයකුටම එම විභාගයෙන් සමත් වූ බවට සහතිකයක් නිකුත් කල යුතු ය. එවැනි සෑම සහතිකයක්ම පාලක සභාවේ සාමාජිකයන් දෙදෙනෙකු විසින් හා ප්‍රධාන විධායක නිලධාරියා විසින් අත්සන් කල යුතු ය. එවැනි සහතික සඳහා ලේඛණයක් ප්‍රධාන විධායක නිලධාරියා විසින් පවත්වාගෙන යා යුතු ය.

11. ඕනෑම විභාගයන් සඳහා විභාග ගාස්තු ගෙවීමෙන් පසු, අපේක්ෂකයා විසින් සිය ප්‍රවේශය අස්කරගතහොත් හෝ එකී විභාගයට පෙනී සිටීමට අපොහොසත්වූවහොත් එම විභාගයට ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබිය යුතු ය ඃ

එසේ වුවද අපේක්ෂකයාගේ රෝගී තත්වයක දී රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් නිකුත් කල වෛද්‍ය සහිතිකයක් ඉදිරිපත් කිරීමෙන් පාලක සභාව විසින් ගෙවන ලද විභාග ගාස්තු වලින් අඩක් ඊළඟට එළඹෙන විභාගය සඳහා විභාග අපේක්ෂකයාගේ ගිණුමේ බැරට මාරු කළ හැකි ය.

12. විභාගයකින් අසමත් වන යම් තැනැත්තකුට විභාග කමිටුව වෙනත් ආකාරයකින් විධාන කර ඇත්නම් මිස, එවැනි විභාගයක් සඳහා ඉදිරි අවස්ථාවකදී නැවත පෙනී සිටිය හැකි ය. කමිටුව එවැනි අපේක්ෂකයකුට ඉදිරියේදී එළඹෙන විභාගයට පෙනී සිටීමට ඉඩදීම ප්‍රතික්ෂේප කළහොත් ඔහුට එකී තීරණයට එරෙහිව පාලක සභාවට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර, එම අභියාචනය පිළිබඳ පාලක සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

13. විභාග කමිටුව විසින් සේවය සඳහා කැඳවනු ලැබූ අවස්ථාවක දී යොදා ගැනීම සඳහා පාලක සභාව විසින් පරීක්ෂකවරු, ප්‍රමානකරුවන් හෝ පරිවර්තකවරු වශයෙන් ධූර දරන්නන්ගෙන් සමන්විත මණ්ඩලයක් පත් කල යුතු ය. පරීක්ෂකවරුන්ට, ප්‍රමානකරුවන්ට හෝ පරිවර්තකවරුන්ට පාලක සභාව විසින් කලින් කලට නියම කරනු ලබන ගාස්තු ගෙවිය යුතු ය. පාලන සභාවේ අභිමතය පරිදි කලින් කල අවශ්‍ය පරිදි මෙම මණ්ඩලයට යම් පරීක්ෂකවරයකු, ප්‍රමානකවරයකු හෝ පරිවර්තකයකු එකතු කිරීමට හෝ ඉවත් කිරීමට හැකි ය.

*ආශ්‍රිත සාමාජිකත්වය සඳහා විභාග (ඒ. සී. එම්. ඒ)*

14. පාලක සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලබන පරිදි, පහත සඳහන් අදියරයන් (මට්ටම්) සමත්වන ශිෂ්‍යයකු ආශ්‍රිත සාමාජිකත්වය ප්‍රදානය කිරීම සඳහා අපේක්ෂයකු වීමට සුදුසුකම් ලැබිය යුතු ය.

(අ) ශිල්පීය අදියර/පදනම් මට්ටම් ( 1 වන මට්ටම) ;

(ආ) අන්තර් මධ්‍ය අදියර/මෙහෙයුම් මට්ටම් (2 වන මට්ටම) ;

(ඇ) වෘත්තීය අදියර I/කළමනාකරණ මට්ටම (3 වන මට්ටම)

(ඈ) වෘත්තීය අදියර II/උපාය මාර්ගික මට්ටම (4 වන මට්ටම) ; සහ

(ඉ) විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනය ඃ

එසේ වුවද, ඉහත සඳහන් අනුපිළිවෙල අනුව මිස කිසිදු අපේක්ෂකයකු ඉහත විභාගවලට පෙනී සිටිමට සුදුසුකම් නොලැබිය යුතු අතර පාලක සභාව විසින් සකසන ලද නිර්නායක අනුව එකම අවස්ථාවේ එක් විභාගයකට හැර පෙනී සිටීමට ඉඩ නොදිය යුතු ය. නමුත් විෂයානුගතව විභාගවලට පෙනී සිටීමට සිසුන්ට අවසර දිය හැකි ය.

15. (1) පහත සඳහන් අවශ්‍යතා සපුරනු නොලබන කිසිදු තැනැත්තකු ශිල්පීය අදියර (පදනම් මට්ටම) අන්තර් මධ්‍ය අදියර (මෙහෙයුම් මට්ටම), වෘත්තීය I අදියර (කළමනාකරණ මට්ටම) හෝ වෘත්තීය II අදියර (උපායමාර්ගික මට්ටම) යන විභාගවලට සහ විෂයානුබද්ධ සිද්ධි අධ්‍යනය ඇතුළත් කරගනු නොලැබිය යුතු ය.

(අ) ආයතනයේ ලියාපදිංචි ශිෂ්‍යයකු වීම ;

(ආ) විභාගයේ දිනය පිළිබඳ ලිඛිත දැන්වීමක් පලකිරීමෙන් පසු අවම වශයෙන් විභාගය පවත්වන දිනට දින අනූවකට (90) පෙර, නියමිත අයදුම්පත්‍රය ප්‍රධාන විධායක නිලධාරියාට හෝ ඔහු විසින් බලය පවරනු ලැබ ඇති වෙනත් නිලධාරියකුට පාලක සභාව විසින් අනුමත කර ඇති ආකෘති පත්‍රය මගින් යම් විභාගයක් සඳහා පෙනී සිටීමට තම කැමැත්ත ප්‍රකාශ කල යුතු වීම ;

(ඇ) ඔහු නිදහස් කරනු ලබන විෂයය හෝ අදියර සනාථ කරමින් ආයතනයෙන් ලිපියක් ලැබීම ; අදාල වේනම් ;

(ඇ) පාලක සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලබන විභාගයේ අදාල අදියර සඳහා වූ නියමිත ගාස්තුව ගෙවා තිබීම.

(2) පාලක සභාව විසින් සකසන ලද නිර්නායක වලට අනුව ආශ්‍රිත කළමනාකරන ගණකාධිකරණ (ඒ එම් ඒ) සුදුසුකම ලබා ඇති ශිෂ්‍යයන්ට වෘත්තීය I අදියර සහ වෘත්තීය II අදියර විභාග සහ විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනය සඳහා පෙනී සිටිය හැකි ය. මෙම විභාග සහ පාලක සභාව විසින් කලින් කල නියම කර ඇති ප්‍රායෝගික පුහුණු සම්පූර්ණ කිරීමෙන් පසුව ආයතනයේ සාමාජිකයකු ලෙස බඳවා ගැනීමට සුදුසුකම් ලබයි.

16. (1) සාමාජිකත්වය සඳහා අයදුම් කිරීම සඳහා අදාල ස්ථානයන්හි වසර තුනක ප්‍රායෝගික පුහුණුව අවශ්‍ය බවට වන නිර්ණායක කලින් කල පාලක සභාව විසින් නිශ්චය කරනු ලබන පරිදි විය යුතු අතර, ඒවා ප්‍රායෝගික පුහුණු මාර්ගෝපදේශයන්හි ප්‍රසිද්ධ කළ යුතු ය.

(2) පහත සඳහන් අවශ්‍යතාවන් සපුරනු නොලබන කිසිම තැනැත්තකු ආයතනයේ සාමාජිකයකු වශයෙන් බඳවාගනු නොලැබිය යුතු ය.

(අ) ආයතනයේ වෘත්තීය II අදියර හෝ උපායමාර්ගික මට්ටම 4 විභාග සහ විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනය සමත්වීම

(ආ) පාලක සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලබන ආකාරයේ වර්ෂ තුනක ප්‍රායෝගික පුහුණුවක් පාලක සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාරික පරිසරයක හෝ වෙනත් අංශයක සම්පූර්ණ කර තිබීම සාක්ෂියක් වශයෙන් ඉදිරිපත් කිරීම ; සහ

(ඇ) 2013 අංක 1 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ (පරිපාලන) රීතින් හි 18 රීතියේ විධිවිධාන සපුරා තිබීම.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම රීතීන්හි ;

"පනත" යන්නෙන් 2009 අංක 23 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය පනත අදහස් වේ ;

"පාලක සභාව" යන්නෙන් ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ පාලක සභාව අදහස් වේ ;

"ප්‍රධාන විධායක නිලධරයා" යන්නෙන්, පනතේ 15(I) වගන්තිය යටතේ පාලක සභාව විසින් පත් කරනු ලබන ප්‍රධාන විධායක නිලධාරියා අදහස් වන අතර, ප්‍රධාන විධායක නිලධරයා වශයෙන් වැඩ බලන වෙනත් යම් නිලධරයකු හෝ යම් තැනැත්තකු ඇතුළත් වේ ;

"ආයතනය" යන්නෙන් 2009 අංක 23 දරන පනත යටතේ පිහිටුවා ඇති ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරන ගණකාධිකාරී ආයතනය අදහස් වේ ;

"ශිෂ්‍යයන්" යන්නෙන් 2009 අංක 23 දරන සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය පනත ආරම්භ වීමට පෙර සමිති ආඥා පනත (123 අධිකාරය වූ) යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ සංගමය යටතේ ලියාපදිංචි වූ ශිෂ්‍යයන් සහ ඉහත පනත යටතේ ආයතනයේ ලියාපදිංචි වූ තැනැත්තන් අදහස් වේ.

03 - 1026/2

එල්.ඩී.බී. 1/2013.

**2009 අංක 23 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය පනත**

19 වන වගන්තිය යටතේ රීති

2009 අංක 23 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතන පනතේ 19 වැනි වගන්තිය යටතේ එකී සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකරී ආයතනයේ සභාව විසින් සාදනු ලැබ සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද රීති.

සභාපති,
ශ්‍රී ලංකා සහතිකලත්
කළමනාකරණ ගණකාධිකාරී ආයතනය.

2014 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

**රීති**

1. මෙම රීති 2013 අංක 03 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (නිලවරණ) රීති යනුවෙන් හැඳින්වේ.

2. පනතේ 8 වැනි වගන්තියේ (2) උපවගන්තියේ (අ) සහ (ඇ) යන ජේදවල සඳහන් පාලක සභාවේ සභාපතිවරයා, උප සභාපතිවරයා සහ සාමාජිකයන් තිදෙනෙක් තෝරා පත්කර ගැනීම ආයතනයේ සාමාජිකයින්ගේ රැස්වීමක දී සිදු විය යුතු අතර එකී රැස්වීම සභාව විසින් තීරණය කරනු ලබන දිනයක දී සහ ස්ථානයක දී සහ වේලාවක දී පවත්වනු ලැබිය යුතු ය. පළමු නිලවරණය සම්බන්ධයෙන් වන විට එම දිනය පනතේ 8 වැනි වගන්තියේ (3) උපවගන්තියේ සඳහන් අවුරුදු හතරක කාලසීමාව අවසන් වීමෙන් පසුව එළඹෙන දින හතකට නොවැඩි දිනයක් විය යුතු අතර පසුව එළඹෙන නිලවරණවලදී එම දිනය සභාවේ සාමාජිකයන්ගේ ධූර කාලය අවසන් වී දින හතකට නොවැඩි දිනයක් විය යුතු ය.

3. (1) ආයතනයේ පාලක සභාවේ සාමාජිකයන්ගේ රැස්විමක් කැඳවීමට නියමිතව ඇති විට එම රැස්වීමේ දිනයට අවම වශයෙන් සති හතරකට පෙර එම රැස්වීම කැඳවන බවට වූ දැන්වීමක් ආයතනයේ දැන්වීම් පුවරුවේ සභාව විසින් ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය. එම දැන්වීම සමඟ එම රීතිවල පිටපතක් අමුණා තැබීම හෝ ප්‍රදර්ශනය කිරීම කළ හැකි ය.

(2) එම දැන්වීම, දැන්වීම් පුවරුවෙහි ප්‍රදර්ශනය කිරීම එකී රැස්වීම පිළිබඳව ආයතනයේ සෑම සාමාජිකයකුට ම කරනු ලබන ප්‍රමාණවත් දැන්වීමක් විය යුතු අතර එය සියළු කාර්ය සඳහා ප්‍රමාණවත් දැන්වීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) එම දැන්වීමේ පිටපතක් ප්‍රධාන විධායක නිලධරයා විසින් ආයතනයේ සෑම සාමාජිකයකු වෙත ම යැවිය යුතු අතර එසේ යවනු ලැබිය යුත්තේ ඔහු වෙත කලින් දැනුම් දී ඇති ලිපිනයට ය.

එසේ වුව ද, එම දැන්වීම යැවීම පැහැර හැරීම හෝ අසමත්වීම හෝ සාමාජිකයන්ට එය නොලැබීම හේතුවෙන් හෝ සඳහන් කල දැන්වීම, රැස්වීම, ඡන්ද විමසීම හෝ ඊට සම්බන්ධ වෙනත් යම් දෙයක් හෝ මෙම රීතිය යටතේ කිරීමට අදහස් කර ඇති වෙනත් යම් දෙයක් අවලංගු නොවිය යුතු හෝ අන්‍යාකාරයෙන් එහි වලංගුභාවයට බලපෑමක් නොවිය යුතු ය.

4. එබඳු සෑම දැන්වීමකම රැස්වීම් වේලාව, දිනය, ස්ථානය සහ කාර්යය නිශ්චිතව සඳහන් විය යුතු අතර පිළිවෙලින් සභාපති, උප සභාපති සහ පාලක සභාවට තෝරා පත්කර ගන්නා සාමාජික තනතුරු තුන සඳහා නාමයෝජනා පත්‍ර එම දැන්වීමේ සඳහන් දිනයට හෝ ඊට පෙර (මෙය රැස්වීම පැවැත්වෙන දිනයට දින දාහතරකට නොඅඩු විය යුතු ය) ප්‍රධාන විධායක නිලධරයාට ලැබිය යුතු බව ද එහි සඳහන් විය යුතු ය. පාලක සභාවේ සාමාජික තනතුරු සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීමේ දී තමා තෝරා පත්කර ගැනීම සඳහා ඉදිරිපත් වනුයේ ව්‍යාපාර කටයුතුවල නියුතු වෘත්තීය ගණකාධිකාරීවරයෙකු ලෙස හෝ වෘත්තියේ නියැලි සාමාජිකයෙකු ලෙස හෝ වෙනත් තැනැත්තෙකු ලෙස ද යන්න සඳහන් කළ යුතු ය. පාලක සභාවේ සාමාජික තනතුරු වලින් දෙකක් ව්‍යාපාරයේ නියුතු වෘත්තීය ගණකාධිකාරීවරුන් දෙදෙනෙකු සඳහා වෙන්කර ඇති බැවින් මෙම අවශ්‍යතාව සපුරාලිය යුතු ය.

5. (1) පහත දැ සපුරා ඇත්නම් මිස ආයතනයේ කිසිදු තැනැත්තකුට පාලක සභාවේ සභාපති තනතුර සඳහා තෝරාපත් කර ගැනීම සඳහා සුදුසුකම් නොලැබිය යුතු ය -

(අ) ඔහු ආයතනයේ අධි සාමාජිකයකු වීම ; සහ

(ආ) (i) පළමු ඡන්ද විමසීමේ දී, අවම වශයෙන් වර්ෂ හතරක කාලසීමාවක් සඳහා පාලක සභාවේ සාමාජිකයකු වශයෙන් සේවය කර තිබීම.

(ii) අනතුරුව පැවැත්වෙන ඡන්ද විමසීම්වල දී ඔහු අවම වශයෙන් වසර හයක කාලයක් සඳහා පාලක සභාවේ සාමාජිකයකු වශයෙන් සේවය කර තිබිය යුතු අතර ඉන් වර්ෂ දෙකක් උපසභාපති ධූරයේ කටයුතු කර තිබිය යුතු ය.

(2) පහත දැ සපුරා ඇත්නම් මිස ආයතනයේ කිසිදු තැනැත්තකුට පාලක සභාවේ උපසභාපති තනතුර සඳහා තෝරාපත් කර ගැනීම සඳහා සුදුසුකම් නොලැබිය යුතු ය.

(අ) ඔහු ආයතනයේ අධි සාමාජිකයකු වීම ; සහ

(ආ) ඔහු අවම වශයෙන් වසර හතරක කාලසීමාවක් සඳහා පාලක සභාවේ සාමාජිකයකු වශයෙන් සේවය කර තිබීම.

6. (1) සෑම නාම යෝජනා පත්‍රයකම අපේක්ෂකයාගේ නම, ආයතනයේ සාමාජිකයකු විය යුතු යෝජනාකරුගේ සහ ස්ථිර කරන්නාගේ නම් සහ අත්සන් ද, අපේක්ෂකයා විසින් අදාළ තනතුර සඳහා තමා යෝජනා කිරීම පිළිබඳව තම කැමැත්ත පළ කරන අත්සන් තැබූ ප්‍රකාශයක් ද ඇතුළත් විය යුතු ය.

එසේ වුව ද, කිසිදු සාමාජිකයකු එක් අපේක්ෂකයකුට වඩා යෝජනා කිරීමට හෝ ස්ථිර කිරීමට හිමිකම් නොලැබිය යුතු ය.

(2) යම් තනතුරක් සඳහා වන නාමයෝජනා ආයතනය විසින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍ර මගින් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර මෙහි උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල විය යුතු ය. පාලක සභාවට තෝරාපත් කර ගැනීම සඳහා නාමයෝජනා ඉදිරිපත් කරන සාමාජිකයන් හට නාමයෝජනා කරනු ලබන තැනැත්තාගේ පහත සඳහන් විස්තර පිළිබඳව පැතිකඩක් ඉදිරිපත් කිරීමට නියම කළ යුතු ය.

(අ) සාමාජිකත්වයට ඇතුළත් කරගත් වර්ෂය සහ සාමාජික ප්‍රභේදය ;

(ආ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ;

(ඇ) කළමනාකරණ ගිණුම්කරණ ක්ෂේත්‍රය පිළිබඳව සහ වෙනත් ක්ෂේත්‍රයන් පිළිබඳව ලබාගත් විශේෂ කාර්ය සිද්ධීන් ;

(ඈ) ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයට කළ සේවාව ;

(ඉ) වර්තමාන හා ඊට පෙර සේවා නියුක්තිය පිළිබඳ විස්තර.

(3) නාම යෝජනා පත්‍රයක ආයතනයේ එක් තනතුරකට හෝ එක් සාමාජිකයකුට වැඩි නාමයෝජනා අඩංගු නොවිය යුතු වුව ද සාමාජිකයෙකු එක් තනතුරකට වඩා වැඩි ගණනකට වෙනත් යෝජනාකරුවකු හා ස්ථිරකරුවකු විසින් නම් කළ හැකි ය.

එසේ වුව ද, සභාපති තනතුරට නාම යෝජනා ඉදිරිපත් කළ තැනැත්තකු තම අකමැත්ත නාම යෝජනා පත්‍රයේ ව්‍යක්ත ලෙස ප්‍රකාශ කළහොත් මිස එනයින්ම සියලු කාර්යයන් සඳහාම උපසභාපති මෙන්ම පාලක සභාවේ සාමාජික තනතුරක් සඳහා ද නාම යෝජනා ඉදිරිපත් කළ තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.

එසේ වුව ද, තවදුරටත් උපසභාපති තනතුර සඳහා නාමයෝජනා ඉදිරිපත් කළ තැනැත්තකු තම අකමැත්ත නාමයෝජනා පත්‍රයේ ව්‍යක්ත ලෙස ප්‍රකාශ කළහොත් මිස එනයින්ම සියලු කාර්යයන් සඳහාම උපසභාපති මෙන්ම පාලක සභාවේ සාමාජික තනතුරක් සඳහා ද නාම යෝජනා ඉදිරිපත් කළ තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) නාම යෝජනා ඉදිරිපත් කල අපේක්ෂකයන් ඉන්පසු විද්‍යුත් තැපෑල මගින්, ලිපි යැවීමෙන් හෝ වාචිකව ඡන්දය ඉල්ලා සිටීම වැනි ඡන්ද කටයුතුවල ස්වභාවයක් ගන්නා ඡන්ද ලබාගැනීමට යොදා ගන්නා ඕනෑම කටයුත්තක යෙදීමෙන් වැලකී සිටිය යුතු ය.

(5) ප්‍රධාන විධායක නිලධරයා විසින් මෙම රීතිවල විධිවිධානවලට එකඟ නොවන නාමයෝජනා පත්‍ර පාලක සභාව විමසා ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය. ඔහු විසින් පාලක සභාව විමසා ඡන්ද විමසීම සඳහා අවශ්‍ය ඡන්ද පත්‍රිකා හා ඡන්ද පෙට්ටි සකස් කිරීම හෝ සකස් කිරීමට සැලැස්වීම සිදුකළ යුතු ය.

(6) යම් ඡන්ද විමසීමක ඡන්දය ලබාදීම, අතින් ඡන්දය සලකුණු කිරීමෙන් හෝ ඉලෙක්ට්‍රොනික ක්‍රමයක් මගින් සිදුවිය යුතු ය. ඉලෙක්ට්‍රොනික ඡන්ද විමසීම පිළිබඳ කාර්ය පටිපාටිය 15 වන රීතිය ප්‍රකාර විය යුතු ය. එසේ වුව ද යම් ඡන්ද විමසීමක් කුමන ආකාරයෙන් පැවැත්වුව ද එම ඡන්ද විමසීම අවලංගු වීමක් හෝ එහි වලංගුභාවයට බලපෑමක් නොවිය යුතු ය.

7. තෝරාගත් නව සභාපතිවරයාගේ පදවි පැවරීම ඡන්දය පවත්වා සති තුනක් ඇතුළත අලුතින් තේරී පත් වූ පාලක සභාව විසින් නිශ්චය කරනු ලබන දිනයක, වේලාවක හා ස්ථානයක පැවැත්විය යුතු ය.

8. (1) නාම යෝජනා පත්‍ර භාරදීමට නියම කර ඇති දිනයට දින දෙකක් පසුවීමට පෙර, ප්‍රධාන විධායක නිලධරයා විසින් පිළිවෙලින් සභාපති, උප සභාපති සහ පාලක සභාවේ සාමාජික තනතුරුවලට විධිමත්ව නාම යෝජනා ඉදිරිපත් කල තැනැත්තන්ගේ නම් අකාරාදී පිළිවෙලට සකස් කල ලැයිස්තු තුනක් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කළ යුතු ය. උප සභාපති තනතුර සඳහා නම්කළ තැනැත්තන්ගේ ලැයිස්තුවේ නිශ්චිතව තම නම, නම් කිරීමට අකමැත්ත ප්‍රකාශ කර ඇති තැනැත්තන්ගේ නම් හැර, සභාපති හා තනතුරු විධිමත්ව නම්කර ඇති තැනැත්තනගේ නම් ද ඇතුළත් කළ යුතු ය. පාලක සභාවේ සාමජික තනතුරු සඳහා නම් කළ තැනැත්තනගේ ලැයිස්තුවේ නිශ්චිතව තම නම නම් කිරීමට අකමැත්ත ප්‍රකාශ කර ඇති තැනැත්තන්ගේ නම් හැර සභාපති හා උප සභාපති තනතුරුවලට විධිමත්ව නම් කර ඇති තැනැත්තන්ගේ නම්ද ඇතුළත් කල යුතුය.

(2) ඉහත ලැයිස්තු තුන දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීම සියලු කාර්යයන් සඳහා ආයතනයේ සෑම සාමාජිකයකුට ම නාමයෝජනා භාරදීම පිළිබඳව ප්‍රමාණවත් දැනුම් දීමක් විය යුතු සහ විය යුතු බවට සලකනු ලැබිය යුතු ය.

(3) ප්‍රධාන විධායක නිලධරයා විසින් ඔහු වෙත කලින් දැනුම් දී ඇති ලිපිනයට ආයතනයේ සෑම සාමාජිකයකුට ම එම ලැයිස්තු තුනෙන් එක් පිටපත බැගින් යැවිය හැකි ය.

එසේ වුව ද, එය යැවීම පැහැර හැරීම හෝ අසමත් වීම හෝ එය සාමාජිකයෙකුට නොලැබීම මගින් නාම යෝජනා, ලැයිස්තු, රැස්වීම, ඡන්ද විමසීම හෝ ඒ හා සම්බන්ධ යම් දෙයක් හෝ මෙම රීතීන් යටතේ කිරීමට උද්දේශිත යම් දෙයක් අවලංගු නොවිය යුතු හෝ එහි වලංගු භාවයට අන්‍යාකාරයෙන් බලපෑමක් ඉන් සිදු නොවිය යුතු ය.

(4) ප්‍රධාන විධායක නිලධරයා විසින් නාමයෝජනා පත්‍ර ලැබ් 6 වැනි රීතියේ (6) වැනි ඡේදය යටතේ ප්‍රතික්ෂේප කළ නාමයෝජනා පත්‍ර සහ එයට හේතුව ද සමඟ එකී තැනැත්තන්ගේ ලැයිස්තුවක් ද නාම පුවරුවේ ප්‍රදර්ශනය කල යුතු ය.

9. යම් තනතුරකට හෝ තනතුරුවලට විධිමත්ව ඉදිරිපත් කරනු ලැබූ නාමයෝජනා පත්‍ර සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි නම් පාලක සභාව විසින් නාමයෝජනා පත්‍ර භාරදීමට නියම කර තිබූ දිනයට පසු සහ රැස්වීම පැවැත්වීමට දින හතකට පෙර කිසිම තනතුරකට නාමයෝජනා පත්‍ර ඉදිරිපත් කර නැති ආයතනයේ හෝ පාලක සභාවේ සාමාජිකයන් අතරින් තැනැත්තන් තුන්දෙනෙකු ඡන්ද විමසීම සඳහා විනිශ්චයකාරවරුන් වශයෙන් පත් කළ යුතු ය.

10. ඉවත්ව යන සභාපති හෝ ඔහු පැමිණ නැත්නම් හෝ අකමැති නම් ඉවත්ව යන උප සභාපති හෝ ඔහු පැමිණ නැත්නම් හෝ අකමැති නම්, රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් පත් කරනු ලබන වෙනත් තැනැත්තකු රැස්වීමේ මුලසුන දැරිය යුතු ය. එසේ වුව ද, ඉවත්ව යන හිටපු සභාපති අලුතින් තෝරා පත් කරගනු ලැබූ සභාවේ උපදේශකයකු වශයෙන් කටයුතු කළ යුතු ය.

11. (1) යම් අපේක්ෂකයකුට රැස්වීම ආරම්භයේ දී නොපමාව ඕනෑම තනතුරක ඡන්ද විමසීමෙන් ඔහුට වාචිකව ඉල්ලා අස්වීම ප්‍රකාශයට පත් කළ හැකි ය. යම් තනතුරක ඡන්ද විමසීමෙන් ඉල්ලා අස් වූ අපේක්ෂකයකු ඔහු විධිමත්ව නාමයෝජනා ඉදිරිපත් කල හෝ ඉදිරිපත් කල බවට සලකනු ලබන වෙනත් යම් තනතුරක් සඳහා වන ඡන්ද විමසීමෙන් ඉල්ලා අස් වූ හෝ ඉල්ලා අස්වූවා සේ සලකනු නොලැබිය යුතු ය.

(2) සභාපති තනතුර සඳහා විධිමත්ව එක් තැනැත්තෙක් පමණක් යෝජනා කර ඇත්නම්, ඒ මත එම තැනැත්තා සභාපති ලෙස නිසි පරිදි තෝරාගත් බවට රැස්වීමේ සභාපති විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

(3) උප සභාපති තනතුරට විධිමත්ව එක් තැනැත්තකු පමණක් යෝජනා කර ඇත්නම් (සභාපති හා උප සභාපති යන එක් එක් තනතුරු සඳහා විධිමත්ව එක් තැනැත්තකු පමණක් යෝජනා කර ඇත්නම් හෝ සභාපති තනතුරට නම් කළ සියලු තැනැත්තන් උප සභාපති තනතුරට නම් කිරීම සඳහා තම අකමැත්ත ව්‍යක්තව ප්‍රකාශ කර ඇති විට) එවැනි යම් තැනැත්තකු එම අවස්ථාවේ දී උප සභාපති ලෙස විධිමත්ව තෝරාපත් කරගත් බවට සභාපති විසින් ප්‍රකාශයට පත් කල යුතු ය.

(4) පාලක සභාවේ සාමාජික තනතුර සඳහා තැනැත්තන් තුන්දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් විධිමත්ව නාමයෝජනා ඉදිරිපත් කර ඇත්නම් (සභාපති සහ උප සභාපති තනතුරුවලට එක් තැනැත්තකු බැගින් පමණක් විධිමත්ව නාමයෝජනා ඉදිරිපත් කර ඇත්නම් හෝ සභාපති සහ උප සභාපති තනතුරුවලට විධිමත්ව නාමයෝජනා ඉදිරිපත් කළ තැනැත්තන් සියලු දෙනාම පාලක සභාවේ සාමාජික තනතුරු සඳහා නම් කිරීමට තම අකමැත්ත ව්‍යක්තව ප්‍රකාශ කර ඇති විට) එම සියලු තැනැත්තන් එම අවස්ථාවේ දී රැස්වීමේ සභාපති විසින් පාලක සභාවේ සාමාජිකයන් ලෙස විධිමත්ව තෝරාපත්කර ගත් බවට ප්‍රකාශ කළ යුතු ය.

12. (1) 11 වන රීතිය යටතේ විධිමත්ව කිසිවෙකුත් තේරී පත් වූ බවට ප්‍රකාශ කර නොමැති තනතුරු සඳහා ඡන්ද විමසීම රහස් ඡන්දයකින් හෝ ඉලෙක්ට්‍රොනික ඡන්ද ක්‍රමයක් මගින් විය යුතු අතර රැස්වීමට පැමිණ සිටින ආයතනයේ සියළුම සාමාජිකයන්ට ඡන්දය දීමට හිමිකමක් ඇත. මෙම කාර්යය සඳහා ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම රැස්වීම ආරම්භ කර පළමු පැය දෙක හමාර තුළ සිදු කළ යුතු අතර, ඡන්දය ප්‍රකාශ කිරීම රැස්වීම ආරම්භ කර පළමු පැය දෙක හමාර තුළ හෝ කලින් කල පාලක සභාව විසින් තීරනය කරනු ලැබිය හැකි පරිදි සිදු කළ යුතු ය.

(2) 8 වැනි රීතියේ සඳහන් ලැයිස්තු තුනෙහි සඳහන් ප්‍රකාර නාමයෝජනා ඉදිරිපත් කළ තැනැත්තන්ගේ නම් ඇතුළත් පිළිවෙලින් සභාපති, උප සභාපති සහ පාලක සභාවේ සාමාජික තනතුරු සඳහා වෙනස් වර්ණ තුනකින් යුක්ත ඡන්ද පත්‍රිකා කට්ටල තුනක් පිළියෙල කළ යුතු ය. ඡන්ද දායකයාට ඡන්දය සඳහන් කිරීම සඳහා එක් එක් ඡන්ද පත්‍රිකාවේ එක් එක් අපේක්ෂකයාගේ නම ඉදිරියෙන් කොටුවක් තිබිය යුතු ය.

(3) පිළිවෙලින් "සභාපති" , "උප සභාපති " සහ "පාලක සභාවේ සාමාජික" යන ලේබල ඇල වූ ඡන්ද පෙට්ටි තුනක් සැපයිය යුතු අතර අදාළ ඡන්ද පෙට්ටියට පමණක් ඡන්ද දැමිය යුතු ය.

(4) සභාපති තනතුර සඳහා තෝරාපත් කර ගැනීමේ දී ඡන්දදායකයකුට සභාපති පදවිය සඳහා තෝරාපත් කර ගැනිමට කැමති අපේක්ෂකයාගේ නම ඉදිරියෙන් ඇති කොටුවේ "1" ඉල්ලක්කම සඳහන් කරමින් තම ඡන්දය ප්‍රකාශ කළ යුතු ය.

(5) උප සභාපති තනතුර සඳහා තෝරාපත්කර ගැනීමේ දී ඡන්දදායකයකුට උප සභාපති තනතුර සඳහා තෝරාපත්කර ගැනීමට කැමති අපේක්ෂකයාගේ නම ඉදිරියෙන් ඇති කොටුවේ "1" ඉලක්කම සඳහන් කරමින් තම ඡන්දය ප්‍රකාශ කළ යුතු ය. ඉහත කී අපේක්ෂකයා යම් හෙයකින් සභාපති තනතුරට පත් වෙතැයි සිතන ඡන්දදායකයකුට ඔහු කැමති අපේක්ෂකයකුගේ නම ඉදිරියෙන් ඇති කොටුවේ "2" ඉල්ලක්කම යෙදිය හැක. එවැනි ඡන්දයක් ගණන් කරනු ලබන්නේ මුලින් කී අපේක්ෂකයා සභාපති තනතුරට පත් වුවහොත් පමණක් විය යුතු අතර අන්‍යාකාරයෙන් නොවිය යුතු ය.

(6) පාලක සභාවේ සාමාජික තනතුරු තුන සඳහා ඡන්ද විමසීමේ දී ඡන්දදායකයකු අපේක්ෂකයන්ගේ නම් ඉදිරියෙන් "1", "2", "3", "4", "5", සහ "6" යනා දී වශයෙන් ඔහු කැමති වරණීය අනුපිළිවෙලට ලකුණු කළ යුතු ය. එම ඡන්ද 13(4) වන රීතියේ විධිවිධාන සලසා ඇති ආකාරයට ගණනය කළ යුතු ය.

13. (1) ඡන්ද පෙට්ටි විවෘත කිරීම, ඡන්ද ගණන් කිරීම, නරක් වූ ඡන්ද පත්‍රිකා ප්‍රතික්ෂේප කිරීම, තෝරාගත් තැනැත්තන් නිශ්චය කිරීම හා මෙහි දක්වා නොමැති ඡන්ද පැවැත්වීම සම්බන්ධයෙන් වන වෙනත් යම කාරණයක් 9 වැනි රීතිය යටතේ පත්කළ විනිශ්චයකාරවරුන් තුන්දෙනාගේ හෝ එකඟවීමට නොහැකි අවස්ථාවන්හි දී ඔවුන් වැඩි දෙනාගේ එකඟතාවය අනුව සිදුකළ යුතු ය. ඡන්ද සමානව ලැබූ අවස්ථාවක දී විනිශ්චයකාරවරුන් කුසපත් ඇදීමෙන් තෝරාගත් තැනැත්තන් නිශ්චය කරනු ලැබිය යුතු ය. 9 වැනි රීතිය යටතේ පත්කළ විනිශ්චයකාරවරුන් එක් අයකු හෝ වැඩිදෙනකු පැමිණ නොසිටින විට අවස්ථාවෝචිත පරිදි, රැස්වීමට පැමිණ සිටින කිසිදු තනතුරකට නම්කර නොමැති යම් තැනැත්තකු හෝ තැනැත්තන් එම පැමිණ නොමැති විනිශ්චයකාරවරයා හෝ විනිශ්චයකාරවරුන් වෙනුවට රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් පත්කර ගත හැකි ය.

(2) සභාපති තනතුර සඳහා ඡන්දය දැමීම සඳහා සපයා තිබූ ඡන්ද පෙට්ටිය පළමුව විවෘතකර ඡන්ද ගණන් කර (විනිශ්චයකාරවරුන් විසින් එසේ දැන් වූ පසු) රැස්වීමේ සභාපති විසින්, සභාපති තනතුර සඳහා වැඩිම වලංගු ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයා සභාපති තනතුරට විධිමත් පරිදි තේරී පත් වූ බවට ප්‍රකාශ කළ යුතු ය.

(3) උප සභාපති තනතුර සඳහා ඡන්දය දැමීම සඳහා සපයා තිබූ ඡන්ද පෙට්ටිය ඊටපසු විවෘත කර ගණන් කළ යුතු ය. යම් ඡන්ද පත්‍රිකාවක සභාපති ලෙස තෝරාපත් කරගත් තැනැත්තාට ඡන්දයක් ප්‍රකාශකර ඇත්නම් එබඳු ඡන්ද ගණන් ගනු නොලබන අතර "2" ඉලක්කම සඳහන් කළ ඡන්ද ඇත්නම් ඒවා ගණන් ගනු ලැබිය යුතු ය. වලංගු ඡන්ද වැඩිම සංඛ්‍යාවක් ලබා ගන්නා අපේක්ෂකයා රැස්වීමේ සභාපති විසින් (විනිශ්චයකාරවරුන් විසින් එසේ දැන් වූ පසු) උප සභාපති තනතුරට විධිමත් ලෙස තේරී පත් වූ බවට ප්‍රකාශ කල යුතුය.

(4) පසුව පාලක සභාවේ සාමාජික තනතුර සඳහා ඡන්දය දැමීම පිණිස සපයා තිබූ ඡන්ද පෙට්ටිය විවෘත කර ඡන්ද ගණන් කළ යුතු ය. ඕනෑම ඡන්ද පත්‍රිකාවක සභාපති හෝ උප සභාපති තනතුරුවලට තෝරාපත්කර ගත් අපේක්ෂකයින්ට ඡන්දයක් හෝ ඡන්ද ප්‍රකාශ කර ඇත්නම්, එබඳු ඡන්දය හෝ ඡන්ද ප්‍රතික්ෂේප කළ යුතු අතර ඒවා ගණන් ගනු නොලැබිය යුතු ය. ඉතිරි පළමු ඡන්ද තුන පමණක් ගණන් කරනු ලැබිය යුතු ය. වැඩිම වලංගු ඡන්ද සංඛ්‍යාවක් ලබාගන්නා අපේක්ෂකයන් තුන්දෙනාගේ නම් (විනිශ්චකාරවරුන් විසින් එසේ දැන් වූ පසුව) රැස්වීමේ සභාපති විසින් පාලක සභාවේ සාමාජිකයන් ලෙස ප්‍රකාශයට පත් කළ යුතු ය.

(5) සභාපති තෝරාපත්කර ගැනීමෙන් පසුව, උප සභාපති තනතුර සඳහා සුදුසු එක් අපේක්ෂකයකු පමණක් ඉතිරිව ඇති බව පෙනී යන්නේ නම්, විනිශ්චයකරුවරුන්ට උප සභාපති තනතුර සඳහා ප්‍රකාශකර ඇති ඡන්ද ගණන් කිරීමේ අවශ්‍යතාවයක් නොමැති විය යුතු ය. උප සභාපති තනතුරට ඡන්ද විමසීමෙන් පසුව පාලක සභාවේ සාමාජික තනතුරු සඳහා සුදුසුකම් ලත් අපේක්ෂකයින් තුන් දෙනෙක් පමණක් හෝ ඊට වඩා අඩු නම් විනිශ්චකාරවරුන්ට පාලක සභාවේ සාමාජික තනතුරු සඳහා ඡන්ද ගණන් කිරීමේ අවශ්‍යතාවයක් නොමැතිව විය යුතු ය. එවැනි අපේක්ෂකයකු හෝ අපේක්ෂකයින් යථා පරිදි උප සභාපති හෝ පාලක සභාවේ සාමාජිකයින් වශයෙන් පිළිවෙලින් තෝරාපත් කර ගත් බැව් (විනිශ්චකාරවරුන් විසින් එලෙස දැන් වූ පසු) ප්‍රකාශයට පත් කළ යුතු ය.

(6) ඡන්ද විමසීම නිමකිරීමෙන් පසුව, යම් තනතුරුවල පුරප්පාඩු ඇත්නම්, රැස්වීමේ සභාපතිවරයා විසින් වහාම නාම යෝජනා කැඳවා රැස්වීමේ දී එම තනතුරු අත් ඔසවා ඡන්ද දීමෙන් පුරවනු ලැබිය යුතු ය.

(7) කිසිම තැනැත්තකු එක් තනතුරකට වඩා පත්කර නොගත යුතු ය.

14. (1) සභාපති, උපසභාපති හෝ පාලක සභාවේ සාමාජිකයකු ලෙස තෝරාපත්කර ගත් සාමාජිකයකුගේ මිය යාමෙන් හෝ තනතුරෙන් ඉවත්වීමේ දී, පාලක සභාවේ අභිමතය පරිදි පාලක සභාව විසින් නියම කරනු ලබන දිනයක, වේලාවක සහ ස්ථානයක පවත්වනු ලබන ආයතනයේ සාමාජිකයන්ගේ රැස්වීමක දී ඡන්දයක් පවත්වනු ලැබිය යුතු ය. එම දිනය එබඳු ඡන්දයක් පැවැත්විය යුතු යයි පාලක සභාව විසින් දැනුවත් වී සති හතරක් නොයික්මවූවක් විය යුතු ය.

(2) එකී රැස්වීමට අවම වශයෙන් සති දෙකකටවත් පෙර පාලක සභාව විසින් එකී රැස්වීම කැඳවීම පිළිබඳ දැන්වීම රැස්වීමේ වේලාව, දිනය, ස්ථානය සහ අරමුණු සඳහන් කරමින් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කළ යුතු ය.

(3) එකී දැන්වීම, දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීම සියලු අරමුනු සඳහා ආයතනයේ සෑම සාමාජිකයකුටම කරනු ලබන ප්‍රමාණවත් දැනුම්දීමක් විය යුතු ලෙස සැලකිය යුතු ය.

(4) ප්‍රධාන විධායක නිලධාරියා විසින් ආයතනයේ සෑම සාමාජිකයෙකුට ම ඔවුන් විසින් මීට ප්‍රථමයෙන් දැනුම් දී ඇති ලිපිනයට එකී දැන්වීමේ පිටපතක් යැවිය යුතු ය.

එසේ වුව ද එය යැවීමට අසමත්වීම හෝ අතපසුවීම හෝ එය සාමාජිකයෙකුට නොලැබීම එබඳු දැන්වීම, රැස්වීම, ඡන්දය හෝ ඒ පිළිබඳව හෝ මෙම රීති යටතේ කරනු ලබන කිසිවක් අවලංගු නොවිය යුතු හෝ වලංගු භාවයට බලපෑමක් සිදු නොවිය යුතු ය.

(5) සභාපති හෝ ඔහු පැමිණ නැත්නම් හෝ අකමැති නම්, උප සභාපති හෝ ඔහු පැමිණ නැත්නම් හෝ අකමැති නම්, රැස්ව සිටින සාමාජිකයින් විසින් පත් කරගනු ලබන වෙනත් නැතැත්තකු රැස්වීමේ සභාපති තනතුරේ කටයුතු කළ යුතු ය.

(6) රැස්වීමේ දී සභාපති විසින්, පිරවිය යුතුව ඇති එක් එක් තනතුර සඳහා නාමයෝජනා කැඳවන අතර එම තනතුරු අත් එසවීමේ ඡන්දයෙන් පුරවනු ලැබිය යුතු ය.

(7) නාමයෝජක තැනැත්තා තම කැමැත්ත දී ඇත්නම් හෝ මීට පෙර නාම යෝජනා කිරීමට ලිඛිතව තම කැමැත්ත දී ඇත්නම් මිස නාමයෝජනා පත්‍ර කිසිවක් වලංගු නොවිය යුතු ය.

(8) මෙම රීතිවල විධිවිධාන සලසා නොමැති යම් රැස්වීමක පැන නගින සුදුසුකම් හෝ කාර්ය පටිපාටිය පිළිබඳ සෑම ප්‍රශ්නයක් ම සභාපති විසින් තීරණය කළ යුතු ය. එම තීරනය අවසාන සහ තීරණාත්මක විය යුතු ය.

15. (1) ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ඡන්දය ලබා දීමේ දී, පහත ක්‍රියා මාර්ග අනුගමනය කළ යුතු ය.

(අ) අපේක්ෂකයන්ගේ නාමලේඛනයක්, ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ඡන්දය ලබාදීම සඳහා භාවිත කරනු ලබන ඉලෙක්ට්‍රොනික ඡන්ද පද්ධතිය මගින් ප්‍රදර්ශනය කළ යුතු අතර ඡන්ද දායකයා විසින් ඔහුගේ මනාපය පද්ධතියේ ඇතුළත් කිරීමෙන් තම කැමැත්ත තෝරාගත හැකි ය ;

(ආ) ඡන්ද දායකයා ලියාපදිංචි කිරීමේ කවුන්ටර අටක හෝ යම් ඡන්ද විමසීමක දී නියම කරනු ලැබිය හැකි වෙනත් යම් සංඛ්‍යාවක ලියාපදිංචි කළ යුතු ය. ඡන්ද දායකයන් ලියාපදිංචි කිරීම ක්‍රියාකරුවන් විසින් ලිඛිතව සඳහන් කිරීමෙන් හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් සිදුකළ යුතු ය ;

(ඇ) ඡන්ද දායකයෙකු නිසි පරිදි ලියාපදිංචි කරනු ලැබූ විට, ලියාපදිංචි කිරීමේ කවුන්ටරයේ සිටින ක්‍රියාකරු විසින් ඡන්දදායකයා එම අවස්ථාවේ පවතින ඡන්ද පොළක් වෙත යොමුකල යුතු අතර එහි දී ඡන්ද දායකයාට තම ඡන්දය ප්‍රකාශ කළ හැකි ය ;

(ඈ) ඡන්දය ලබාදීම එක් එක් ඡන්ද පොළෙහි පවතින ඉලෙක්ට්‍රොනික ඡන්ද පද්ධතියක් මගින් සිදු කළ යුතු අතර එම පද්ධතිය අපේක්ෂකයන්ගේ නම් පිළිබඳ තොරතුරු ප්‍රදර්ශනය කිරීම සහ ස්පර්ශක තිර යන්ත්‍රණයක් මගින් හෝ නියෝග මගින් නියම කර ඇති වෙනත් යම් ක්‍රමයක් මගින් ඡන්ද දායකයාට තමා තෝරා ගනු ලැබූ අපේක්ෂකයා පෙන්නුම් කිරීම සඳහා නිර්මාණය කර තිබිය යුතු ය. පාලක සභාවේ සභාපති, උප සභාපති හා සාමාජිකයන් යන තනතුරු සඳහා ඡන්දය ලබාදීමේ කාර්යය පටිපාටිය සමාන විය යුතු ය ;

(ඉ) සභාපතිවරයා, උප සභාපතිවරයා සහ පාලක සභාවේ සාමාජිකයන් සඳහා ඡන්ද ලබාදීමේ දී, අවශ්‍ය අවස්ථාවක දී එය මුද්‍රිතයක් මගින් තහවුරු කළ යුතු අතර විගණන ඉඟියක් සඳහා එය වාර්තාවක් වශයෙන් තබාගත යුතු ය.

(2) ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ඡන්දය ලබාදීමේ දී හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් හා අතින් ඡන්දය සලකුණු කිරීමෙන් ඡන්දය ලබාදීමේ යම් ඡන්ද විමසීමක දී ඉලෙක්ට්‍රොනික ඡන්ද ලබාදෙන අතරතුර යම පද්ධති බිඳවැටීමක්, ප්‍රමාදයක් හෝ ක්‍රියා විරහිත වීමක් සිදුවුවහොත්, ලබාදෙනු ලබන ඡන්ද පත්‍රිකා භාවිතා කිරීමට ඡන්ද දායකයන්ට ඉඩ දිය යුතුය. ඡන්දය ලබාදීම සඳහා ලබාදෙන ලද කාලසීමාව අවසන් වීමෙන් පසු ඉලෙක්ට්‍රොනික ඡන්ද පද්ධතියේ ක්‍රියාකරු විසින් පත් කරනු ලබන බලයලත් නිලධරයකු විසින් අත්සන් කරන ලද මුද්‍රිත ප්‍රතිඵල ලේඛනයක ආකාරයෙන් වන ප්‍රතිඵල තීරකයා වෙත ලබාදිය යුතු ය. තීරකයා විසින් එම ප්‍රතිඵල පැය දෙකක කාලසීමාවක් ඇතුළත ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

(3) ඡන්දය ලබාදීමේ කාර්ය පටිපාටිය, ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් හෝ ඡන්ද පත්‍රිකා යොදා ගනිමින් අතින් ඡන්දය සලකුණු කිරීමෙන් ඡන්දය ලබාදීම වශයෙන් වෙනස් විය යුතු ද යන්න පිළිබඳව තීරකයා විසින් තීරණය කරනු ලැබිය හැකි අතර එය පහත දැක්වෙන පරිදි විය යුතු ය.

(අ) ලියාපදිංචි කිරීමේ කවුන්ටර වල සිටින කාර්ය මණ්ඩලය විසින්, ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ඡන්දය ලබා නොදුන් ඉතිරි සාමාජිකයන් වෙත පාලක සභාවේ සභාපති, උප සභාපති සහ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම සඳහා වන මුද්‍රිත ඡන්ද පත්‍රිකා නිකුත් කළ යුතු ය ;

(ආ) ඡන්ද දායකයා විසින් තමන් කැමති අපේක්ෂකයාගේ නම ඉදිරියෙන් ඔහුගේ මනාපය සලකුණු කිරීමෙන් ඡන්දය ලබාදිය යුතු අතර මෙම කාර්ය සඳහා තබන ලද ඡන්ද පෙට්ටියක් තුළට එම ඡන්ද පත්‍රිකාව ඇතුළු කළ යුතු ය ;

(ඇ) අතින් ඡන්දය සලකුණු කිරීමෙන් ඡන්දය ලබාදීමේ ක්‍රියාදාමය අවසන් වීමෙන් පසු, ඡන්ද පත්‍රිකා හා ඡන්දය ලබාදීමේ ක්‍රියාදාමය තුළ දී ඉලෙක්ට්‍රොනිකව නිපදවන ලද මුද්‍රිතය අතින් ගණන් කළ යුතු අතර තීරකයා විසින් ප්‍රතිඵල ප්‍රකාශයට පත් කළ යුතු ය.

16. ඡන්ද විමසීම එබඳු විධිවිධානවලට අඩංගු මූලධර්මවලට පටහැනි නොවන පරිදි සහ එසේ අපොහොසත් වීම ඡන්ද විමසීමේ ප්‍රතිඵලයට බලපෑමක් නොමැති බවට පෙනී යන්නේ නම්, මෙම රීතිවල විධිවිධානවලට අනුකූලවීමට අපොහොසත් වීම කිසිදු ඡන්ද විමසීමක් අවලංගු වීමට හේතුවක් නොවිය යුතු ය.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම රීතීන්හි ;

"පනත" යන්නෙන් 2009 අංක 23 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය පනත අදහස් වේ ;

"විගණන ඉඟිය" යන්නෙන් යම් ඡන්ද විමසීමක දී ඉලෙක්ට්‍රොනිකව ලබාදෙන ලද ඡන්ද සංඛ්‍යාව පිළිබඳව අතින් ගණන් කිරීමෙන් සිදු කරනු ලබන විගණනයක් සහ එක් එක් තරඟකරුට ඡන්ද දායකයන් විසින් ලබාදෙන ලද ඡන්ද සංඛ්‍යාව පෙන්නුම් කරනු ලබන ඡන්ද ක්‍රියාදාමය තුළ නිපදවන ලද යම් මුද්‍රිතයක් අදහස් වේ ;

"ප්‍රධාන විධායක නිලධරයා" යන්නෙන්, පනතේ 15(I) වගන්තිය යටතේ පාලක සභාව විසින් පත් කරනු ලබන ප්‍රධාන විධායක නිලධාරියා අදහස් වන අතර, ප්‍රධාන විධායක නිලධරයා වශයෙන් වැඩ බලන වෙනත් යම් නිලධරයකු හෝ යම් තැනැත්තකු ඇතුළත් වේ ;

"සභාව" යන්නෙන් ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ පාලක සභාව අදහස් වේ ;

"ඉලෙක්ට්‍රොනික ඡන්ද පද්ධතිය" යන්නෙන් ස්වයංක්‍රීය පෙළගැස්මේ උපකරණයක් හෝ දත්ත සැකසීමේ උපකරණයක් යොදා ගනිමින් ඡන්දය ලබාදීම සිදු කරනු ලබන හෝ ඡන්ද පෙළගස්වනු ලබන පද්ධතියක් අදහස් වේ.

"ආයතනය" යන්නෙන් ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරන ගණකාධිකාරී ආයතනය අදහස් වේ ;

"ආයතනයේ සාමාජික" යන්නෙන් සාමාජිකත්වය කාලය ගෙවී යෑම හෝ වෙනත් ලෙසකින් සාමාජිකත්වය අවලංගු වීම හෝ තහනම් කිරීම හෝ සමාප්ත කිරීම හෝ සාමාජිකත්වය අහෝසි නොවූ ආයතනයේ සාමාජිකයකු වන තැනැත්තෙක් අදහස් වේ.

"දැන්වීම් පුවරුව" යන්නෙන් සාමාන්‍යයෙන් ආයතනයේ සහ පාලක සභාවේ රාජකාරිමය දැන්වීම් සහ සන්නිවේදන ප්‍රදර්ශනය කරනු ලබන ආයතනයේ ප්‍රධාන කාර්යාලයේ ඇති දැන්වීම් පුවරුව අදහස් වේ.

"ලියාපදිංචි කිරීමේ මධ්‍යස්ථානය" යන්නෙන් යම් ඡන්ද විමසීමක් තුළ දී ඡන්ද දායකයන් ලියාපදිංචි කරනු ලබන ස්ථානයක් වශයෙන් පාලක සභාව විසින් හඳුනාගනු ලැබූ යම් මධ්‍යස්ථානයක් අදහස් වේ.

"ඡන්ද මධ්‍යස්ථානය" යන්නෙන් ඡන්දය ඇතුළත් කිරීම සඳහා යම් ස්පර්ශක තිරකයක් යොදා ගනිමින් හෝ පාලක සභාව විසින් තීරනය කරන ලද වෙනත් යම් ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් යොදා ගනිමින් ඉලෙක්ට්‍රොනිකව ඡන්දය ලබාදීම සඳහා එක් එක් ලියාපිදංචි කිරීමේ මධ්‍යස්ථානයේ ලාබා දී ඇති යම් ඉලෙක්ට්‍රොනික පහසුකමක් අදහස් වේ.

*උපලේඛනය*

*ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය*

**නාම යෝජනා පත්‍රය**

| | | |
|---|---|---|
| අපේක්ෂකයාගේ තනතුර | : ............................................................................. | 1 |
| අපේක්ෂකයාගේ නම | : ............................................................................. | |
| යෝජනා කළේ | : ............................................................................. | 2 |
| | ............................................................................. | 3 |
| ස්ථිර කළේ | : ............................................................................. | 2 |
| | ............................................................................. | 3 |
| | ............................................................ තනතුර සඳහා නාමයෝජනා කිරීමට කැමැත්තෙමි. | |
| | මම .......................................................... තනතුර/තනතුරු සඳහා මගේ නම යෝජනා කිරීමට නොකැමැත්තෙමි. | 4 |
| | ............................................................................. | 5 |
| | ............................................................................. | 6 |

1. තනතුර සඳහන් කරන්න, එනම් සභාපති, උප සභාපති හෝ පාලක සභාවේ සාමාජික
2. නම
3. අත්සන
4. අදාළ නොවන දෑ කපාහරින්න හෝ අත්හරින්න
5. තනතුර සඳහන් කරන්න, එනම් උප සභාපති සහ හෝ පාලක සභාවේ සාමාජික
6. අපේක්ෂකයාගේ අත්සන

ඔබගේ නාම යෝජනා .......................... දිනට පෙර ප්‍රධාන විධායක නිලධරයා වෙත යැවිය යුතු බව සැලකිය යුතු අතර එම දිනයේ ප.ව. 4.00 ට එම කාලසීමාව අවසන් වේ.

(කරුණාකර ඔබගේ නාම යෝජනා ප්‍රධාන විධායක නිලධරයා වෙත භාරදීමට එවන ලද වහාම ප්‍රධාන විධායක නිලධරයා විසින් රිසිට් පතක් නිකුත් කරනු ඇත. නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් නාම යෝජනා භාර ගැනීම අවසන් වන දිනට පෙර ප්‍රධාන විධායක නිලධරයා වෙත යැවිය යුතු ය. තැපෑලෙන් ලැබෙන නාම යෝජනා පිළිබඳව දින තුනක් ඇතුළත ඒවා ලැබුණු බව දැනුම් දෙනු ඇත.)

03 - 1026/3

එල්.ඩී.බී. 1/2013.

**2009 අංක 23 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය පනත**

19 වැනි වගන්තිය යටතේ රීති

2009 අංක 23 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය පනතේ 19 වැනි වගන්තිය ප්‍රකාර පාලක සභාව වෙත පැවරී ඇති බලතල අනුව ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකරී ආයතනයේ පාලන සභාව විසින් සාදනු ලැබ සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද රීති.

සභාපති,
ශ්‍රී ලංකා සහතිකලත්
කළමනාකරණ ගණකාධිකාරී ආයතනය.

2014 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

**රීති**

1. මෙම රීති 2013 අංක 04 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතන (වෘත්තීය විෂමාචාරය) රීති යනුවෙන් හැඳින්වේ.

2. (1) වෘත්තිය විෂමාචාරය සඳහා වැරදිකරු වීමේ හේතුවෙන් යම් ගණකාධිකාරීවරයකු හෝ මූල්‍ය කළමනාකරුවකු වෘත්තීය කටයුතුවලට ඒ තැනැත්තා නුසුදුසුයයි පාලක සභාව සෑහීමට පත්වන්නේ නම් පාලක සභාව විසින් ඕනෑම සාමාජිකයකු ආයතනයේ සාමාජිකත්වයෙන් ඉවත් කල හැකි ය.

(2) යම් ගණකාධිකාරිවරයකු හෝ මූල්‍ය කළමනාකරුවකු වෘත්තීය කටයුතු වලට සුදුසු යයි පාලක සභාව විසින් සෑහීමට පත්වන්නේ නම්, එම් පුද්ගලයා නැවත බඳවා ගැනීමට 2 (1) රීතිය යටතේ කරන ලද ඉවත් කිරීම බාධාවක් නොවිය යුතු ය.

3. (1) අදාළ තැනැත්තා වෘත්තිය විෂමාචාරයට වරදකරු වී ඇතැයි විනය කමිටුවක් විසින් කරනු ලබන විභාගයකින් අනතුරුව පාලක සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් වී ඇත්නම් මිස පාලක සභාව විසින් 2 (1) වගන්තිය යටතේ කිසිම තැනැත්තකු ඉවත් නොකළ යුතු ය.

(2) (අ) පාලක සභාව වෙත කරනු ලැබූ පැමිණිල්ලක් මත හෝ පාලක සභාවේ ම නිරීක්ෂණ මත ආයතනයේ සාමාජිකයකු වන යම් තැනැත්තකු වෘත්තීය විෂමාචාරය යන වරදට වරදකරු වී ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති අවස්ථාවක දී, ඒ සාමාජිකයාට එරෙහිව බැලූ බැල්මට පෙනෙන වෘත්තීය විෂමාචාර චෝදනාවක් ඇත් ද යන්න පරීක්ෂා කොට පාලක සභාව වෙත වාර්තාවක් සැපයීම සඳහා අවම වශයෙන් සාමාජිකයන් තිදෙනෙකුගෙන් යුත් විමර්ශන කමිටුවක් පාලක සභාව විසින් පත් කළ හැකි ය.

(ආ) ඉහත (අ) උපඡේදය යටතේ පත් කළ විමර්ශන කමිටුව විසින් සාමාජිකයකුට එරෙහිව බැලූ බැල්මට වෘත්තීය විෂමාචාරය පිළිබඳ චෝදනාවක් ඇතැයි පාලක සභාව වෙත වාර්තා කළ අවස්ථාවක දී පාලක සභාව වෙත කල පැමිණිල්ලක් මත හෝ සිය නිරීක්ෂණ මත එම සාමාජිකයා සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමේ කාර්යය සඳහා පාලක සභාව විසින් විනය කමිටුවක් පත් කල යුතු ය.

4. කමිටුව ඉදිරියේ සාක්ෂි දීමට කැඳවූ සෑම පුද්ගලයෙකුගෙන්ම දිව්රුමක් හෝ ප්‍රතිඥාවක් ලබා ගැනීමේ බලය විනය කමිටුවට තිබෙන අතර එවැනි දිව්රුමක් හෝ ප්‍රතිඥාවක් ලබා දීම හෝ පරීක්ෂණය පැවැත්වීමට අදාලව ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අසනු ලබන පැනයට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරන සෑම පුද්ගලයෙකුම පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

5. විනය කමිටුව ඉදිරියේ විභාගයට භාජනය වන තැනැත්තකු දිව්රුම් දීම හෝ සහතික කිරීම මත චේතනාන්විතව සාවද්‍ය සාක්ෂි ලබා දේ නම්, ඒ සෑම තැනැත්තකුම පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

6. විනය කමිටුව විසින් සහභාගි වීමට හෝ යම් ලියවිල්ලක් ඉදිරිපත් කිරීමට දන්වමින් දැන්වීමක් භාර දෙන ලද යම් තැනැත්තකු සාධාරණ හේතුවක් නොමැතිව දැන්වීමේ සඳහන් වේලාවට සහ ස්ථානයට අවස්ථාවෝචිත පරිදි සහභාගි වීමට හෝ ලියවිලි ඉදිරිපත් කිරීමට අසමත් වන අවස්ථාවක, ඔහු පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

7. මෙම වගන්තිය යටතේ පත් කරනු ලබන විනය කමිටුවල ව්‍යවස්ථාවලිය සහ අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එවැනි කමිටු විසින් පවත්වනු ලබන පරීක්ෂණ කටයුතු සහ ක්‍රියාත්මක කළ යුතු බලතල සම්බන්ධයෙන් මෙම රීතිවල පළමුවන උපලේඛනයේ විධිවිධාන අදාල විය යුතු ය.

8. මෙම රීතිවල පළමුවන සහ දෙවන උපලේඛනයන් සඳහන් යම් විධිවිධානයක් හෝ සෑම විධිවිධනයක්ම සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම හෝ ඊට යමක් එකතු කිරීම හා ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම පාලක සභාවේ නිර්දේශය මත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් කළ හැකි ය.

9. දෙවන රීතියෙන් ආවරණය වන බලය ක්‍රියාත්මක කරනු වෙනුවට අවවාද කිරීම හෝ තරවටු කිරීම, හෝ පාලක සභාව විසින් සුදුසු යයි සලකනු ලබන කාලයකට තැනැත්තකුගේ සාමාජිකත්වය අත්හිටුවීම, හෝ රුපියල් දස දහසකට නොවැඩි දඩයක් හෝ එවැනි දඩයක් සහ එවැනි සාමාජිකත්වය අත්හිටුවීමක් නිකුත් කිරීම හෝ අවවාද කිරීම හෝ තරවටු කිරීම කළ හැකි ය.

10. 2 වැනි හෝ 3 වැනි රීතීන් යටතේ පාලක සභාවේ යම් තීරණයක් මඟින් අතෘප්තියට පත්වන යම් තැනැත්තකු විසින් එවැනි තීරනයකට එරෙහිව, පාලක සභාව විසින් පත් කරනු ලබන, ආයතනයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් වෙත පළමු අවස්ථාවේ දී අභියාචනය කළ හැකි ය. එවැනි කමිටුවක තීරණයෙන් අතෘප්තියට පත් තැනැත්තකු විසින් එම තීරණයට එරෙහිව ඉන් පසුව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

11. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම රීතීන්හි ;

"පනත" යන්නෙන් 2009 අංක 23 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය පනත අදහස් වේ ;

"සභාව" යන්නෙන් ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ පාලක සභාව අදහස් වේ ;

"වෘත්තීය විෂමාචාරය" යන්නෙන් මෙම රීතිවල දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් අදහස් වේ ;

(7 රීතිය)

*පළමු උපලේඛනය*

*විනය කමිටු වල සංයුතිය සහ විනය කමිටු විසින් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය*

1. ආයතනයේ සාමාජිකයකුගේ උද්දේශිත විෂමාචාර චෝදනා සම්බන්ධයෙන් පවත්වන්නට යෙදෙන යම් පරීක්ෂණවල කාර්ය සඳහා පාලක සභාව විසින් කුසපත් ඇදීම මඟින් ආයතනයේ සාමාජිකයන් තිදෙනෙකුගෙන් යුත් විනය කමිටුවක් පත්කරනු ලැබිය යුතු අතර, ඔවුන් අතුරින් එක් අයකු කමිටුවේ සභාපති වශයෙන් පත් කල යුතු ය.

2. (1) විනය කමිටුව විසින් විමර්ශනය කළ යුතු චෝදනා ඇතුලත් ප්‍රකාශයක් පාලක සභාව විසින් සකස් කළ යුතු අතර, එහි පිටපත් විනය කමිටුවේ එක් එක් සාමාජිකයන් වෙත සහ විමර්ශනයට භාජනයවන තැනැත්තනා වෙත භාර දීම ප්‍රධාන විධායක නිලධාරි විසින් කල යුතු ය.

(2) යම් තැනැත්තකුගේ විෂමාචාරය සම්බන්ධයෙන් වූ පෙත්සමක් හෝ පැමිණිල්ලක් මත පරීක්ෂණ පවත්වනු ලබන අවස්ථාවක, ප්‍රධාන විධායක නිලධාරියා විසින් එයට අමතරව එවැනි තැනැත්තකුට සහ විනය කමිටුවේ එක් එක් සාමාජිකයාට පෙත්සමෙහි හෝ පැමිණිලලේ පිටපතක් භාර දෙනු ලැබිය යුතු ය. පාලක සභාව විසින් සිය නිරීක්ෂණ මත විමර්ශනය වෙනත් ආකාරයකට පවත්වනේ නම්, එම නිරීක්ෂණ මත පාලක සභාව විසින් චෝදනා ප්‍රකාශයක් සකස් කළ යුතු ය.

3. (1) ප්‍රධාන විධායක නිලධාරියා විසින් පරීක්ෂණය පැවැත්වීමට නියමිත පළමු දිනය තීරණය කොට විමර්ෂණයට යටත් තැනැත්තාට දැන්වීම කළ යුතු ය. එවැනි සෑම දැන්වීමක්ම පරීක්ෂණය නියම කරගත් දිනට අවම වශයෙන් දින 14 කට පෙර අතින් භාර දීම හෝ ලියාපදිංච තැපෑලෙන් හෝ එම තැනැත්තාගේ අවසන් වරට දන්වා සිටින ලද ලිපිනයට යැවීම කළ යුතු ය.

(2) 3 (1) ඡේදය යටතේ දැන්වීමක් භාරදෙන ලද යම් තැනැත්තකු පුද්ගලිකව හෝ නීතිඥයකු මාර්ගයෙන් පෙනී සිටීමට අපොහොසත් වුවහොත්, ඔහු නොමැතිව පරීක්ෂණය පැවැත්වීමට විනය කමිටුව විසින් පරීක්ෂණයක් පවත්වනු ලැබිය හැකි ය.

(3) පරීක්ෂණය කල් දැවූ දිනය හෝ දැන්වීම, විනය කමිටුව විසින් පරීක්ෂණයට විෂයගත වූ තැනැත්තාට පුද්ගලිකව හෝ 3 (1) ඡේදයේ දක්වා ඇති ආකාරයට දැනුම් දිය යුතු ය.

(4) (1) යම් තැනැත්තකුගේ සාක්ෂියක් හෝ එවැනි තැනැත්තකු විසින් ඉදිරිපත් කරනු ලබන යම් ලේඛනයක් විනය කමිටුව විසින් යම් කාරණයක් විභාග කිරීම සඳහා අවශ්‍ය යයි පාලක සභාව අදහස් කරන්නේ නම්, දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට සහ අදාල වේලාවට එම තැනැත්තාට පැමිණෙන ලෙස හෝ ලේඛන ඉදිරිපත් කරන ලෙස දන්වමින් දැන්වීමක් එම තැනැත්තාගේ අවසන්වරට දන්නා නේවාසික ස්ථානයේ ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් යැවීම හෝ අතින් භාර දීම සිදු කරන ලෙස පාලක සභාව විසින් ප්‍රධාන විධායක නිලධාරියා වෙත විධාන කළ යුතු ය.

(2) පාලක සභාවේ තත්කාලයේ ධූර දරන ප්‍රධාන විධායක නිලධාරියා සෑම විනය කමිටුවකම ලේකම් වශයෙන් කටයුතු කල යුතු අතර, මෙම රීති යටතේ නිකුත් කරන සෑම දැන්වීමක්ම ඔහු විසින් අත්සන් කරනු ලැබිය යුතු ය. එසේම ඔහු කමිටුවේ කාර්ය සටහන් වාර්තා කල යුතු ය.

(3) යම් තැනැත්තකුගේ හැසිරීමක් පරීක්ෂණයක විමර්ශනයට යටත්ව ඇති අවස්ථාවක හෝ ඔහු එවැනි යම් පරීක්ෂණයක් හා සම්බන්ධ සැලකිල්ල යොමු වී ඇති වරදකට හසුවී ඇති අවස්ථාවක, එක් නීතිඥවරයකු හෝ නීතිඥවරුන් වැඩි ගණනක් මගින් හෝ ආයතනයේ ඕනෑම සාමාජිකයකු මගින් ඉදිරිපත් විය හැකි ය. ඕනෑම නීතිඥවරයකුට හෝ ආයතනයේ ඕනෑම සාමාජිකයකුට සාක්ෂි මෙහෙයවීමේ දී හා සාක්ෂි ලබා ගැනීමේ දී විනය කමිටුවට සහය වීමට පාලක සභාව විසින් අනුමැතිය දිය හැකි ය.

(4) පාලක සභාව විසින් අන්‍යාකාරයකින් තීරණය කරන්නේ නම් මිස විනය කමිටුව විසින් පවත්වනු ලබන සෑම පරීක්ෂණයක්ම රහසිගතව පැවැත්විය යුතු ය.

(5) විනය කමිටුව ඉදිරියේ ඇති ඕනෑම ප්‍රශ්නයක් එම කමිටුවේ බහුතර සාමාජික තීරණය මත නිශ්චය කළ යුතු ය.

(6) විමර්ශනයක් අවසන් කිරීමෙන් පසුව, විනය කමිටුව විසින් පවත්වන ලද පරීක්ෂණයේ තීරණය ඇතුලත් වාර්තාවක් සකස් කරස පාලක සභාවට ඉදිරිපත් කළ යුතු අතර එම වාර්තාවේ පිටපතක් පරීක්ෂණයට විෂය වූ තැනැත්තා වෙත යැවීම සඳහා කටයුතු සැලැස්විය යුතු ය.

(11 රීතිය)

*දෙවන උපලේඛනය*

*ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සදාචාරමය හැසිරීම් පිළිබඳ ප්‍රමිතීන්*

1. ජාත්‍යන්තර ගණකාධිකාරී සම්මේලනය විසින් 2010 දී නිකුත් කරන ලද සදාචාරය පිළිබඳ සංග්‍රහය සහ එහි පසුව කරන ලද සංශෝධන සහතිකලත් කළමනාකරන ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයින් සඳහා අදාළ විය යුතු ය.

2. සදාචාරය පිළිබඳ ප්‍රමිතීන්

වෘත්තියෙහි නියැලෙන මූල්‍ය කළමනාකරුවන් සහ කළමනාකරණ ගණකාධිකාරීවරුන් සඳහා වූ සදාචාරමය හැසිරීම පිළිබඳ ප්‍රමිතීන් වෘත්තියේ දී සදාචාරාත්මක හැසිරීම් ක්‍රියාවට නංවන ආකාරයට නිශ්චිතව දක්වනු ලබයි.

"වෘත්තිමය විෂමාචාරය" යන්නෙන් පහතින් දක්වා ඇති යම් ක්‍රියාවක් හෝ පැහැර හැරීම් අදහස් වේ. ඒවා ජනතාව සමඟ ඉහල මට්ටමක පැවතීමට හේතුවන නිපුනත්වය, රහස්‍යභාවය, අවංකබව, අරමුණුසහගතබව සහ යහපත් හැසිරීම වේ.

පහත සඳහන් ප්‍රමිතීන්ට අවනත වීම සාමාජිකයන්ගේ වගකීම වේ.

නිපුනත්වය : (1) සිය දැනුම සහ කුසලතා පිළිබඳ අඛන්ඩ වර්ධනයක් මගින් සුදුසු මට්ටමේ වෘත්තිය නිපුනත්වයක් පවත්වාගෙන යාම.

(2) අදාල නීති, නියෝග සහ තාක්ෂණික කුසලතා ප්‍රකාරව සිය වෘත්තිමය රාජකාරි ඉටු කිරීම.

(3) අදාල සහ විශ්වසනීය තොරතුරු මත සුදුසු විශ්ලේශනයකින් පසුව පූර්ණ සහ පැහැදිලි වාර්තා සහ නිර්දේශ සකස් කිරීම

රහස්‍යභාවය : (1) නිසි බලය ඇති අධිකරනයක් මගින් නීත්‍යානුකූලව එසේ කිරීමට බැඳී ඇති විට හැර අන් කිසි විටක තම කටයුතු තුලින් ලබා ගන්නා රහස්‍ය තොරතුරු හෙළිදරව් කිරීමෙන් වැලකී සිටීම.

(2) සිය කාර්යයන්හීදි ලබා ගන්නා තොරතුරුවල රහස්‍යභාවය පිළිබඳව සුදුසු පරිදි යටතේ සේවකයින් දැනුවත් කිරීම සහ එම රහස්‍යභාවය පවත්වා ගැනීම සහතික කරනු පිණිස ඔවුන්ගේ කටයුතු අධීක්ෂණය කිරීම.

(3) සිය කාර්යයන්හි දි ලබා ගන්නා රහස්‍ය තොරතුරු පෞද්ගලිකව හෝ තෙවන පාර්ශවයක් හරහා සදාචාර විරෝධී හෝ නීති විරෝධී ප්‍රතිලාභ සඳහා භාවිතා කිරීමෙන් හෝ ඒ වෙනුවෙන් පෙනී සිටීමෙන් වැලකීම.

(4) සත්‍ය හෝ පැහැදිලිව පෙනෙන ගැටුම් සහගත සම්බන්ධතා වැලැක්වීමට හා විය හැකි ගැටුම් පිළිබඳව අදාළ සියලුම පාර්ශවයන් වෙත උපදෙස් දීම.

(5) අපක්ෂපාතීව සිය රාජකාරි කටයුතු කර ගෙන යාමේ හැකියාම ඍජුව හෝ සැලකිය යුතු තරමේ අගතියක් වන පරිදි යම් කටයුත්තක් සැලසුම් කිරීමෙන් වැලකීම.

(6) අවංකභාවයට බලපෑමක් වේයයි පෙනෙන හෝ එයට බලපෑ හැකි ඕනෑම ත්‍යාග, පක්ෂපාතීත්වයක්, හෝ ආගන්තුක සත්කාර ප්‍රතික්ෂේප කිරීම.

(7) ආයතනයේ ජයග්‍රහණ සහ සමාජයේ නීත්‍යානුකූල සහ සදාචාරමය අරමුනු වෙනස් කිරීම් සක්‍රියව හෝ අක්‍රියව සම්බන්ධ වීමෙන් වැලකීම.

(8) ඕනෑම වෘත්තියමය පැවරුමක් අරමුණුසහගත තීරණයන් හෝ ජයග්‍රාහී කාර්ය සාධනයන් වලකන වෘත්තියමය සීමා හා අනෙකුත් බාධා හඳුනාගැනීම සහ සන්නිවේදනය කිරීම.

(9) අහිතකර මෙන්ම හිතකර තොරතුරු සහ අදාල වෘත්තියමය තීරණ හෝ මතයන් සන්නිවේදනය කිරීම

යහපත් හැසිරීම, අරමුණු සහ ගත බව :

(1) ආයතනය හෝ වෘත්තිය අවමානයට පත්විය හැකි ආකාරයේ ඕනෑම ක්‍රියාවක නියැලීමෙන් හෝ ඊට අනුබල දීමෙන් වැලකීම.

(2) සාධාරණ ලෙස සහ අරමුණු සහගත ලෙස අදාල උපායමාර්ගික තොරතුරු සන්නිවේදනය කිරීම.

(3) ඉදිරිපත් කරනු ලබන වාර්තා, විවේචනයන් හා නිර්දේශයන් පිළිබඳ අපේක්ෂිත පරිශීලකයන්ගේ අවබෝධයට බලපෑමක් වේයයි සාධාරණ ලෙස හැගෙන සියලු අදාල තොරතුරු සම්පූර්ණයෙන්ම අනාවරණය කිරීම.

3. (*අ*) සාමාජිකයෙක් සෑම අවස්ථාවක දීම -

(i) මහජනතාවට වගකීමෙන් සහ විශ්වාසවන්ත භාවයෙන් යුක්තව කටයුතු කල යුතු ය.

(ii) ආශ්‍රිත සාමාජිකයන්, සේවාදායකයින් සහ සේවායෝජකයින් වෙත පක්ෂපාතීත්වයෙන් සැලකිය යුතු ය සහ

(iii) වෘත්තීයමය අවංකත්වයේ සහ පෞද්ගලික ගෞරවයේ ඉහළටම කැප වෙමින් වෘත්තියමය සංවර්ධනය හරහා නිපුනත්වය ඇති කර ගත යුතු ය.

(*ආ*) සාමාජිකයෙක් -

(i) සැමවිටම සිතීමේ සහ ක්‍රියාවන්හි ස්වාධීනත්වය පවත්වාගත යුතු ය.

(ii) තම මතය සියලු කරුණු දන්නා අයකු විසින් ස්වාධීන, අපක්ෂපාතී සහ විෂයානුගතයයි සැලකීමට බලාපොරොත්තු වේද යන්න තීරණය කිරීම සඳහා පළමුව තමා සහ සේවා දායකයා අතර සම්බන්ධතාවය පිළිබඳව තක්සේරුවක් නොමැතිව මූල්‍ය වාර්තා හෝ ප්‍රකාශ පිළිබඳ මත ප්‍රකාශ කිරීම හෝ කළමනාකාරීත්ව ගිණුම්කරණමය පැවරුම් භාරගැනීම නොකළ යුතු ය.

(iii) මූල්‍ය වාර්තා හෝ ප්‍රකාශන සැකසීමේ දී හෝ මූල්‍ය වාර්තා හෝ ප්‍රකාශන පිළිබඳ මත ප්‍රකාශ කිරීමේ දී එවැනි වාර්තා හෝ ප්‍රකාශන නොමග යවන සුලු ඒවා නොවීමට, මතයක් ප්‍රකාශ කිරීමට ප්‍රමාණවත් තොරතුරු ලබා ගැනීමට සහ පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්ම ප්‍රමාණාත්මකව බැහැරවීම හෝ ඉවත්වීම් වාර්තා කිරීමට හැකිවන ලෙස එම සාමාජිකයා දන්නා සියලු ප්‍රමාණාත්මක කරුණු හෙළිදරව් කළ යුතු ය.

(ඇ) සාමාජිකයෙක් -

(i) ඔහුම හෝ ඇයම හෝ යම් හවුල්කරුවකු හෝ සේවකයෙක් පිළිබඳ නඩු කටයුත්තක දී හෝ පාලක සභාවේ නෛතික අධිකාරියක් හෝ ආයතනයේ වෙනත් යම් කමිටුවක් විසින් නියෝගයක් මගින් සිදුකලා යයි කියන වෘත්තිය විෂමාචාරයට විරුද්ධව යම් නීතිමය පරීක්ෂණයක දී, හෝ වෙනත් නීතිමය ක්‍රියාවලියක දී හෝ තම කාර්යය නිසි පරිදි ඉටු කිරීමේ අරමුණට අවශ්‍ය ප්‍රමාණයට හැර තම සේවා යෝජකයාගේ හෝ ඔහු හෝ ඇය රාජකාරි ඉටුකිරීමේ දී සේවා දායකයාගේ කිසියම් රහස්‍ය තොරතුරක් හෙළිදරව් නොකල යුතු ය.

(ii) කළමනාකරණ ගිණුම්කරණ පැවරුමක තමාගේ යම් ව්‍යාපාරික සම්බන්ධතාවයක් හෝ හිමිකමක් පිළිබඳ ව ඔහු හෝ ඇයගේ සේවායෝජක හෝ සේවාදායක ඔවුන් දැනුවත් කරනු ඇතැයි සාධාරණ ලෙස අපේක්ෂා කරනු ලබන අවස්ථාවක දී, ඒ පිළිබඳව ඔවුන් වෙත දැනුම් දිය යුතු ය.

(iii) සේවායෝජකයාගේ හෝ සේවාදායකයාගේ දැනුම සහ එකඟත්වය නොමැතිව තම සේවායෝජකට හෝ සේවාදායක හට සිය කටයුතු ඉටු කිරීමේ දී ගාස්තුවක්, දීමනාවක් හෝ ප්‍රතිලාභයක් දරා සිටීම, භාර ගැනීම, යම් ගාස්තුවක් අත්පත් කර ගැනීම හෝ ඒ සඳහා ඉල්ලා සිටීම නොකල යුතු ය.

(iv) උපදේශකයකු ලෙස කටයුතු කිරීම ඇරඹීමේ දී එම කාර්යයේ අරමුණ සහ විෂයපථ පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඇති කර ගැනීම සහ හැකි නම් කාර්යය ආරම්භ කිරීමට පෙර හෝ ආරම්භ කළ පසු හැකි ඉක්මනින් පිරිවැය වාර්තාවක් සේවාදායකයා වෙත ලබා දීම සඳහා සියලු සාධාරණ පියවර ගනු ලැබිය යුතු ය.

(ඇ) සාමාජිකයෙක් -

(i) අනෙකුත් සාමාජිකයන් සමග විනීතව සහ අවංකව හැසිරිය යුතු ය.

(ii) කළමනාකරන ගිණුම්කරණ වෘතිතියට හෝ ආයතනයට අපකීර්තියක් ගෙන එන ක්‍රියාවක් සිදු නොකල යුතුය.

(iii) ආයතනයේ මතය අනුව කළමනාකරන ගණකාධිකරයෙකුගේ වෘත්තිය ආචාරධර්ම වලට නොගැලපෙන ව්‍යාපාරික කටයුත්තකට හෝ රැකියාවකට සම්බන්ධවීම හෝ ඒ පිළිබඳ උපදෙස් ලබා දීම සිදු නොකල යුතු ය.

(iv) අදාළ කාර්යය සමග සාමාජිකයාගේ සම්බන්ධතාවය අවසන් වී ඇත්නම් හැර නැතිනම් ඔහුගේ කාර්යයන් සමාලෝචනය කිරීම සිය සාමාන්‍ය රාජකාරි යටතේ ගැනෙන, සියලුම අනෙකුත් සාමාජිකයන් දැනුවත් ඒවා නම් හැර එකම සේවා යෝජකයකු යටතේ වූ තවත් සාමාජිකයකුගේ කාර්යයන් සමාලෝචනය කිරීමට අදාල යම් කටයුත්තක් ඔහුගේ දැනීම සහ ලිඛිත එකඟත්වයක් නොමැතිව භාර ගනු නොලැබිය යුතු ය.

(v) කළමනාකාරිත්ව ගිණුම්කරණ කටයුතු ලබා ගැනීම සඳහා අනෙකුත් සාමාජිකයන් හට යම් අතිරේක ලාභ හෝ කොමිස් ගෙවීම හෝ පිළිගැනීම මගින් අසාධාරන වාසි ලබා ගැනීම සඳහා තැත් නොකළ යුතු ය.

(vi) කරනු ලබන කළමනාකාරිත්ව ගිණුම්කරණ කටයුතු සඳහා ප්‍රමාණවත් වන්දි මුදලක් යන මූලධර්මය පවත්වාගෙන යා යුතු ය.

(vii) ද්වේශසහගත ලෙස හෝ වෙනත් ක්‍රමයකට මහජනයා වෙත හෝ වෙනත් සාමාජිකයකුගේ වෘත්තිමය කීර්තියට හෝ ව්‍යාපාරික කටයුත්තකට අහිතරක ලෙස බලපාන ආකාරයට කටයුතු නොකල යුතු ය.

(ඉ) සාමාජිකයෙක් -

(i) පාලක සභාව විසින් කලින් කලට නිශ්චිතව දන්වනු ලබන නිපුනත්වය පිළිබඳ ප්‍රමිතීන් සෑම විටම පවත්වාගෙන යා යුතු ය.

(ii) කළමනාකරන ගිණුම්කරණ වෘත්තියට අදාළව ආයතනය සහ වෘත්තිය තුල පොදුවේ වැඩි දියුණු වන සංවර්ධනය පිළිබඳ දැනුම ආයතනයේ අන්‍යයන් වෙත බෙදා හරිනු ලැබිය යුතු ය.

(iii) ඔහුගේ හෝ ඇයගේ පුහුණුව සහ පලපුරුද්ද මත කැමැත්ත අනුව ඉටු කිරීමට හැකි කාර්යයන් පමණක් භාර ගන්නා අතර සේවා යෝජක හෝ සේවාදායකගේ කැමැත්ත ඇති අවස්ථාවක දී, වෙනත් විශේෂඥයකු සම්බන්ධ කර ගැනීමට සේවායෝජකට හෝ සේවාදායකයා සමග ගිවිස ගැනීම හෝ උපදෙස් දීම සිදු කළ යුතු ය.

(iv) ආයතනයේ කීර්තියට, අභිමානයට සහ ගෞරවයට අදාලව සාමාජිකයෙකුගේ යම් අදක්ෂ, සදාචාර වීරෝධී, නීති විරෝධී හෝ අසාධාරණ හැසිරීමක් හෝ පරිචයක් පිළිබඳව ආයතනයේ නිසි විනිශ්චය මණ්ඩලයක් ඉදිරියේ හෙළිදරව් කල යුතු ය.

(v) ඔහු හවුල්කරුවකු, ප්‍රමුඛ හවුල්කරුවකු, අධ්‍යක්ෂවරයකු හෝ නිලධාරියකු ලෙස කටයුතු කරන වෘත්තියමය හවුල් ව්‍යාපාරයක් හෝ සමාගමක් වෘත්තිය ආචාරධර්ම සංග්‍රහයෙන්, වෘත්තිය ආචාර රීතීන්ගෙන් සහ ආයතනය විසින් කළමනාකාරීත්ව ගිණුම්කරණය සඳහා පිහිටුවනු ලබන වෘත්තිය හැසිරීම් පිළිබඳ රීති වලින් බැඳීම සහතික කිරීමට උත්සාහ දැරිය යුතු ය.

4. ආයතනය වෙත කරනු ලබන කිසියම් පැමිණිල්ලක් හෝ වෙනත් ලෙසකින් සදාචාරමය හැසිරීම් පිළිබඳ රීති කඩකිරීමක්, විමර්ශනයන් සහ පරීක්ෂණ කාර්ය පටිපාටි ඇතුලත්ව, මෙම වෘත්තියමය සංග්‍රහය කඩ කරන අවස්ථාවල දී හෝ එසේ වේයයි පිළිගනු ලබන අවස්ථාවල දී දිය යුතු දඬුවම් සඳහා සේවය අත්හිටුවීම, දඩගැසීම, තදින් අවවාද කිරීම සහ මේ සියල්ලම හෝ බරපතල අවස්ථාවල දී සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සඳහා මෙහි පළමුවන උපලේඛනයේ දක්වා ඇති ආයතනයේ පරීක්ෂණ, ක්‍රමවේදය ඇතුළත් ව්‍යවස්ථාව විධිමත්ව යොදා ගනු ලැබිය යුතු ය.

03 - 1026/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.